// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 1809/12 - 2013 මැයි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2013.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් 2013 අප්‍රේල් 4 වන දින සම්මත කරන ලදුව 2013 අප්‍රේල් 22 වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,<br>
ලේකම්,<br>
ඌව පළාතේ පළාත් සභාව.

2013 අප්‍රේල් මස 23 වැනි දින,<br>
බදුල්ල රජ වීදියේ පිහිටි,<br>
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාවේ 2013 අංක 1 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය**

ඌව පළාත තුල වෙසෙන අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමයින්ගේ රැකවරණය හා සංවර්ධනය උදෙසා පවත්වන ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය හා මෙහෙයවීම සඳහා ද ඊට ආනුශාංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය 1941 අංක 22 දරන අනත්දරු නිවාස ආඥා පණතට (142 අධිකාරය) මෙම ප්‍රඥප්තිය මගින් අනනුකූල කරනු ලැබේ. 1939 අංක (48) දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනතේ අංක 50, 51 අධිකාරය මෙයින් අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1A - PG 001627— 320 (2013/05)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ලුහුඬු නාමය.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ 2013 අංක 1 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කල දිනයේ සිට ක්‍රියාත්මක වේ.

I වන කොටස

**අරමුණු සහ කාර්යයන්**

අරමුණු..

2. ඌව පළාත තුළ සිටින උපතේ සිට අවුරුදු දහඅට දක්වා වූ අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට හා අපචාරවලට ලක්වූ ළමුන්ට සුහසිද්ධින් සැලසීම හා සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම මෙම ප්‍රඥප්තියේ අරමුණ වේ.

කාර්යයන්.

(1) නේවාසික පරිසරය තුල භාරය, ආරක්ෂාව හා රැකවරණය සැලසීම ;

(2) වයසට සහ වැඩීමට අනුකුල සමබල ආහාරපාන ලබාදීම ;

(3) සෞඛ්‍යාරක්ෂිත සහ පරිසරානුකුල ඇඳුම් පැළඳම් ලබාදීම ;

(4) පුනරුත්ථාපන ක්‍රියාවලිය මගින් මානසික සුරක්ෂිතතාවයට හා සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැලසීම ;

(5) අවස්ථානුකුලව විධිමත්, නොවිධිමත් අධ්‍යාපනයක් සහ වෘත්තීය පුහුණුවක් ලබාදීම ;

(6) දක්ෂතා හා නිර්මාණශීලි හැකියාවන් වර්ධනය වන පරිදි සෞන්දර්යාත්මක, ක්‍රීඩා සහ වෙනත් අවශ්‍ය පහසුකම් සැලසීම ;

(7) රසඥතාවය වර්ධනය වන පරිදි අවශ්‍ය පහුසකම් සැලසීම ;

(8) දැනුම හා බුද්ධි වර්ධනයට අවශ්‍ය පුස්තකාල හා වෙනත් පහසුකම් සැපයීම ;

(9) ආගමික, සංස්කෘතික, සදාචාරාත්මක හා අධ්‍යාත්මික සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැපයීම ;

(10) ඥාතීන් හා භාරකරුවන් සමග මනා සම්බන්ධතාවයක් ඇති කර සුදුසු අවස්ථාවේ දී දරුවන් උපරිම යහපතට කටයුතු කිරීම.

පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා ගේ කාර්යභාරය.

3. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය හා පරිපාලනය කිරීම සඳහා මෙහි මින් මතු "කොමසාරිස්වරයා" ලෙස හඳුන්වනු ලබන ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් නමින් කොමසාරිස්වරයකු ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතුවන අතර, කොමසාරිස්වරයා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ දෙවන පන්තියේ නිලධාරියෙකු විය යුතුය. තවද ඔහුට සහය වනු පිණිස නියෝජ්‍ය සහකාර කොමසාරිස්වරුන්ද, පරිවාස නිලධාරිවරුන්ද අවශ්‍ය යැයි හැඟෙන වෙනත් සුදුසු හා යෝග්‍ය නිලධාරීන්ද පත් කරගනු ලැබිය හැකිය.

II වන කොටස

**ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, ලියාපදිංචිය අවලංගු කිරීම හා කළමනාකරණය කිරීම**

ළමා සංවර්ධන මධ්‍යස්ථාන.

4. ඌව පළාත තුල සිටින උපතේ සිට අවුරුදු දහඅට දක්වා වූ අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමුන් භාර ගන්නා, ඔවුන්ට ආරක්ෂාව සලසන හා ඔවුන් නේවාසිකව රැකබලා ගන්නා ඌව පළාතේ පිහිටි සෑම ආයතනයක්ම මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලෙස සැලකිය යුතුය.

ලියාපදිංචි විය යුතු බව.

5. ඌව පළාත තුල පිහිටි සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්ම මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය ලබාගත යුතුය.

(1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙර ආරම්භ කරනු ලැබූ රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක් හෝ රාජ්‍ය නොවන ආයතනයක් විසින් පවත්වා ගෙන යනු ලබන සෑම ළමා නිවාසයක්ම මෙම ප්‍රඥප්තිය යටතේ නැවත ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි විය යුතුය ;

(2) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කර ගනිමින් කොමසාරිස් විසින් පූර්වයෙන් කරන ලද පරීක්ෂණයන්ද සලකා බලා ලියාපදිංචිය සඳහා අවසර දියයුතු අතර, වසර තුනකට වරක් කරනු ලබන සමාලෝචනයට අනතුරුව ලියාපදිංචිය අලුත් කළ යුතුය. ඌව පළාත තුල ලියාපදිංචිය අයදුම් කළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යායුතු අතර, සුදුසු ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ලියාපදිංචිය ලබා දිය යුතුය ;

(3) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පසු ආරම්භ කරනු ලබන සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්ම මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි විය යුතුය. ආයතන සඳහා ළමුන් ඇතුළත් කරගත යුත්තේ ලියාපදිංචි කිරීමෙන් පසුව වන අතර, ළමුන් ඇතුළත් කිරීම කොමසාරිස් මඟින් සිදුවිය යුතුය.

6. ඉහත පස්වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීම සඳහා නැවත ඉල්ලුම් කරනු ලබන සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්ම පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය. ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම්

(1) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම පරමාර්ථ කොට ගත් ව්‍යවස්ථාවක් සහිත ලියාපදිංචි රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන සහ රජයට සම්බන්ධ ආයතනයක් විය යුතුය ;

(2) දැනටමත් ඌව පළාත තුළ පවත්වාගෙන යන ඕනෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචිය සඳහා අවම වශයෙන් ළමුන් දහයක් වත් සිටිය යුතුය ;

(3) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ආයතනයට එම ආයතනය සතු සියලුම චංචල හා නිශ්චල දේපල වල නීත්‍යානුකූල අයිතිය පැවතිය යුතුය ;

(4) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ආයතන සතුව රුපියල් ලක්ෂ පහකට නොඅඩු ස්ථාවර අරමුදලක් තිබිය යුතුය ;

(5) මෙහි තුන්වන උප ලේඛනයේ සඳහන් ප්‍රමිතීන් අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යා යුතුය.

7. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා වන සෑම ඉල්ලීමක්ම ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ හිමිකරු හෝ කළමනාකරු හෝ පාලක විසින් මෙම ප්‍රඥප්තියේ පළමු උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයක් මඟින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. රජයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල බලය කොමසාරිස්වරයා සතුවේ. ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරන ආකාරය.

8. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ලැබුණු පසු කොමසාරිස්වරයා විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් සපයන ලෙස කොට්ඨාසය භාරව සිටින ස්ථානභාර පරිවාස නිලධාරිට නියම කරනු ලැබිය හැකිය. වාර්තා කැඳවීම.

(1) එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානය හය වන වගන්තිය යටතේ ලියාපදිංචිය කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් සපුරා තිබේ ද යන වග ;

සහ

(2) කොමසාරිස්වරයා විසින් මෙම ප්‍රඥප්තියේ විසි හතර වන වගන්තිය යටතේ නිකුත් කර ඇති නියමයන් හා කොන්දේසිවලට අනුකූලව පවතින්නේ ද යන වග.

9. අටවන වගන්තියේ සඳහන් නියමය ලැබී සති හතරක් ඇතුළත අදාළ වාර්තා එකී නිලධාරියා විසින් කොමසාරිස්වරයා වෙත ලබා දිය යුතුය. වාර්තා ලබාදීම.

10. නව වන වගන්තියේ සඳහන් වාර්තා ලැබීමෙන් පසු සතියක් ඇතුළත ළමා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් නේවාසික ළමුන්ගේ උපරිම සුභසිද්ධිය සඳහා කටයුතු කිරීමට හැකියාවක් තිබේ ද, නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූල වන්නේ ද, හය වන වගන්තියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබේ ද, යන කාරණා සම්බන්ධව කොමසාරිස්වරයා විසින් ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ගොස් පරීක්ෂා කර බැලිය යුතුය. කොමසාරිස්වරයා විසින් පරීක්ෂා කිරීම.

11. දහ වන වගන්තියේ සඳහන් පරීක්ෂණයකින් පසු කොමසාරිස්වරයා සෑහීමකට පත්වන්නේ නම් එම ළමා සංවර්ධන මධ්‍යස්ථානය පරීක්ෂණ දිනයේ සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි කිරීමට සහ නිශ්චිත කොන්දේසි සහිත ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කළ යුතුය. ලියාපදිංචි කිරීම.

ලියාපදිංචි කිරීමේ සහතිකය.

12 (1) නව වන වගන්තියේ සඳහන් වන වාර්තාව ලැබීමෙන් පසු කොමසාරිස්වරයාගේ පරීක්ෂණයෙන් ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන ළමා සංවර්ධන මධ්‍යස්ථානය සමග ගිවිසුමක් අත්සන් කිරීමෙන් අනතුරුව එම සංවිධාන වෙත මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් කොමසාරිස්වරයා විසින් නිකුත් කළ යුතුය.

(2) එසේ පළමු වරට ලියාපදිංචිය, ලියාපදිංචි කළ දින සිට වසර තුනක කාලයකට අදාළ වන්නේය. එම වසර තුනක කාලය අවසන් වීමට තෙමසකට ප්‍රථමයෙන් මධ්‍යස්ථානයේ කළමණාකරු විසින් ඒ සම්බන්ධයෙන් කරනු ලබන ඉල්ලීමක් මත අදාළ ලියාපදිංචිය වසරින් වසර දීර්ඝ කිරීම සඳහා කොමසාරිස්වරයාට බලය ඇත. එසේ දීර්ඝ කිරීම සඳහා කරන සෑම ඉල්ලුම් කිරීමක් සම්බන්ධයෙන්ම මෙම ප්‍රඥප්තියේ හය, හත, අට හා නවය වගන්තිවල සඳහන් විධි විධාන අදාළ වන්නේය ;

(3) ලියාපදිංචි කරනු ලබන සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයකම නම, ලිපිනය, ලියාපදිංචි අංකය හා දිනය, ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යන සංවිධානයේ නම සහ වෙනත් අවශ්‍ය වේ යැයි කොමසාරිස්වරයා විසින් සළකනු ලබන තොරතුරු ඇතොත් ඒ තොරතුරු ද ඇතුළත් කරමින් ලේඛනගත කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

ලියාපදිංචි කළ නොහැකි බව දැන්වීම.

13. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හය වන වගන්තියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති විට ඒ ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලියාපදිංචි කළ නොහැකි බව හේතු සහිතව කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරු වෙත දන්වා යැවිය යුතුය.

අභියාචනා.

14. දහ තුන්වන වගන්තියේ සඳහන් දැන්වීමෙන් තෘප්තියට පත් නොවේනම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරු විසින් දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත් ඒ පිළිබඳව අභියාචනයක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

අභියාචනා පිළිබඳ තීරණ.

15. දහ හතර වන වගන්තිය යටතේ අභියාචනයක් ලැබී දෙසතියක් ඇතුළත් කොමසාරිස්වරයා විසින් පෞද්ගලිකව පරීක්ෂා කර බලා පහත සඳහන් තීරණයන්ගෙන් එකක් ගත යුතුය.

(1) ලියාපදිංචි කළ නොහැකි නම් ඒ බව සහ ඊට හේතු කළමණාකරුට නැවත දැන්වීම ;

(2) අභියාචනයේ කරුණු සලකා බලා සෑහීමකට පත්විය හැකි නම් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම ;

(3) හය වන වගන්තියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීමට මාස තුනකට නොවැඩි සහන කාලයක් ලබා දීම.

ලේකම්වරයා වෙත අභියාචනා ඉදිරිපත් කිරීම.

16 (1) ඉහත 15(1) වගන්තිය පරිදි කොමසාරිස්වරයා විසින් ලබාදුන් තීරණයෙන් සෑහීමකට පත් නොවන මධ්‍යස්ථාන හිමිකරුවෙකුට හෝ කළමනාකරුවෙකුට එක් අභියාචනයක් පමණක් කොමසාරිස් වරයාගේ තීරණයේ දින සිට මසක් ඇතුළත ,ලේකම්වරයා, යනුවෙන් සඳහන් කරනු ලබන ඌව පළාතේ පරිවාස හා ළමාරක්ෂක විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ හැක ;

(2) පහළොස් වන වගන්තියේ (3) උප වගන්තිය ප්‍රකාරව දෙනු ලබන සහන කාලය අවසන් වීමෙන් පසු කොමසාරිස්වරයා විසින් නැවත විමර්ශනය කර එම ආයතනය ලියාපදිංචි කිරීම හෝ නොකිරීම හෝ සම්බන්ධයෙන් තීරණ ගතයුතු අතර අදාළ තීරණය කොමසාරිස්වරයා විසින් කළමනාකරුට දැන්විය යුතුය ;

(3) ඉහත (1) වන උප වගන්තිය පරිදි අභියාචනයක් ලද විට ලේකම්වරයා විසින් පරීක්ෂණයක් පවත්වා තීරණයක් ලබාදිය යුතු අතර, ලේකම්වරයා විසින් ලබාදෙනු ලබන තීරණය අවසාන තීරණය විය යුතුය.

ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ලියාපදිංචිය අවලංගු කිරීම.

17. පහත සඳහන් අවස්ථාවක දී තමා විසින් හෝ තමා විසින් බලය පවරනු ලබන වෙනයම් නිලධාරියෙකු විසින් හෝ කරනු ලබන පරීක්ෂණයකින් පසුව ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ලියාපදිංචිය අවලංගු කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත. එනම්,

(1) ඒ ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යන ස්වේච්ඡා සංවිධානයේ සාමාජිකයින්ගේ ව්‍යවස්ථාපිත රැස්වීමකදී, පැමිණ ඡන්දය දෙන බහුතරයකගේ ඡන්දයෙන් සම්මත යෝජනාවක්

මඟින් ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට නොහැකි බව තීරණය කරනු ලැබුවහොත් වසා දැමීමට යෝජිත දිනයට තෙමසකට පෙර ඒ බව කොමසාරිස්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. එම ලිඛිත දැනුම්දීම කොමසාරිස්වරයා විසින් පිළිගනු ලැබූ අවස්ථාවකදී ;

(2) තිස් හයවන වගන්තිය යටතේ නිසි බලධාරියෙකු පත් කිරීමට අපහසු වන අවස්ථාවකදී හෝ පත්කළ නිලධාරියාට තම කටයුතු කර ගෙන යාමට නොහැකි තත්ත්වයක් උදාවන විටදී ;

(3) විසි හතරවන වගන්තිය යටතේ සඳහන් තුන් වන උපලේඛනයේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලව සහ වරින් වර කරනු ලබන නියෝග, රෙගුලාසි, කොන්දේසි හා චක්‍රලේඛ අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට පාලක මණ්ඩලය කටයුතු නොකරන අවස්ථාවකදී ;

(4) තිස් නව වන වගන්තිය අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථානය සඳහා නව පාලක මණ්ඩලය පත්කර ගැනීමට නොහැකි වූ අවස්ථාවකදී ;

(5) එකොළොස්වන වගන්තියේ ප්‍රකාරව ඇති කරගත් ගිවිසුමේ කොන්දේසි ඉටු කිරීමට අපොහොසත් වුවහොත් හෝ පැහැ හැරියහොත්.

ලියාපදිංචිය අවලංගු කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

18. දහ හත්වන වගන්තිය ප්‍රකාරව යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ලියාපදිංචිය අවලංගු කළයුතු යැයි කොමසාරිස්වරයා විසින් තීරණය කළ පසු දින තිහක් ඇතුළත් ඒ බව කොමසාරිස්වරයා විසින් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරුට ලියාපදිංචි තැපෑලෙන් දැන්විය යුතුය. ලියාපදිංචිය අවලංගු කළ බව දැන්වීම.

19. දහ අට වන වගන්තියේ සඳහන් කොමසාරිස්වරයාගේ තීරණයට එම ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරු හෝ පාලක මණ්ඩලය එකඟ නොවන අවස්ථාවකදී ඒ තීරණ දිනයේ සිට දින දහ හතරක් ඇතුළත කළමනාකරු විසින් අභියාචනයක් කොමසාරිස්වරයා මඟින් ලේකම්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ හැකිය. අභියාචනා ඉදිරිපත් කිරීම.

(1) මෙම වගන්තියේ ප්‍රකාර අභියාචනයක් ඉදිරිපත් කළ අවස්ථාවක විසි වන වගන්තියේ සඳහන් පරිදි ලේකම්වරයාගේ තීරණය ලැබෙන තෙක් ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට කළමනාකරුට හා පාලක මණ්ඩලයට බලය ඇත. එතෙකුදු වුවත්, ඔවුන්ට එසේ කළ හැක්කේ කොමසාරිස්වරයාගේ උපදෙස් හා අධීක්ෂණය මතය.

20. දහ නව වන වගන්තිය ප්‍රකාරව අභියාචනයක් ලද පසු ලේකම්වරයා විසින් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය. ලේකම්ගේ තීරණය.

(1) කොමසාරිස්වරයාට සමාන හෝ ඊට ඉහළ තනතුරක් දරන නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මඟින් කරනු ලබන පරීක්ෂණයකින් පසු පහත සඳහන් ක්‍රියාමාර්ග වලින් එකක් ගත යුතුය ;

(අ) ලියාපදිංචිය අවලංගු කිරීම හෝ තහවුරු කිරීම ;

(ආ) කොමසාරිස්වරයාගේ තීරණය සම්බන්ධයෙන් ලේකම්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසි සපුරන තෙක් ලියාපදිංචිය අවලංගු කිරීම උපරිම වශයෙන් මාස තුනකට කල් දැමීම.

(2) (අ) පළමු වන උප වගන්තිය යටතේ ලේකම්වරයා විසින් ගනු ලබන තීරණයන් අභියාචනය ලැබුණු දිනයේ සිට මාසයක් ඇතුළත කළමනාකරු වෙත කොමසාරිස්වරයාට පිටපතක් සහිතව ලේකම්වරයා විසින් ලිඛිතව දැන්විය යුතුය ;

(ආ) ඉහත විසි වන වගන්තියේ (1) ආ යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත ලබාදෙන ලද කාල සීමාව ඉක්මවීමෙන් පසු ලේකම්වරයා විසින් නැවත පරීක්ෂණයක් පවත්වා විසි වන වගන්තිය (1) අ අනුව ක්‍රියා කළ යුතුය ;

(3) මෙම වගන්තිය යටතේ ලේකම්වරයා විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය විය යුතුය.

21. විසිවන වගන්තියේ 1 හා 2 උප වගන්ති ප්‍රකාරව ලියාපදිංචිය අවලංගු කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක සිටින, අධිකරණ නියෝගයක් නොලැබූ සියළුම නේවාසික ළමුන් දෙමාපියන් හෝ භාරකරුවන් වෙත භාර දීම, ලියාපදිංචිය අවලංගු කළ

අවස්ථාවකදී ගත යුතු පියවර

අධිකරණ නියෝග නොලැබූ දරුවන් අධිකරණය වෙතට ඉදිරිපත් කර ඒ ප්‍රකාරව කටයුතු කළ යුතුය. ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය අනුව හා ආගම ඇදහීමේ පහසුකම් ඇති වෙනත් ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට මාරු කිරීම කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ පරිවාස නිලධාරියෙකු විසින් කළ යුතුය.

ලියාපදිංචි අවලංගු කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වත්කම් පැවරීම.

22. ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට රජය විසින්, ස්වෙච්ඡා සංවිධාන විසින්, ආයතන විසින් හෝ පුද්ගලයන් විසින් ලබා දී ඇති ජංගම හා ස්ථාවර වත්කම් දෙපාර්තමේන්තුව භාරයට ගැනීමට හෝ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට පැවරීමට කොමසාරිස්වරයාට හැකි විය යුතුය.

පාලක මණ්ඩලයේ සංයුතිය.

23. පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සඳහාම පාලක මණ්ඩලයක් සහ කළමනාකරුවෙකු පත්කර ගත යුතුය.

(1) එම පාලක මණ්ඩලය සභාපති, උප සභාපති, ලේකම් , උප ලේකම්, භාණ්ඩාගාරික, ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරු සහ කාරක සභිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. මෙම සාමාජිකයන්ගේන් බහුතරයක් ඌව පළාතේ අය විය යුතුය. කළමනාකරු විදේශිකයෙකු වන අවස්ථාවකදී සම කළමනාකරුවෙකු පත්කර ගත යුතුය ;

(2) පාලක මණ්ඩලයේ භාණ්ඩාගාරික සහ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමණාකරු හෝ සම කළමණාකරු ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය ;

(3) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමණාකරු හෝ සම කළමණාකරු ඇතුළු අවම වශයෙන් පාලක මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකු ඌව පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය ;

(4) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමණාකරු ඇතුළු පාලක මණ්ඩලයේ සාමාජිකයින් සියළු දෙනා අධිකරණය මඟින් සාපරාධී වරදකට දඬුවම් ලැබූ අය නොවිය යුතුය.

ප්‍රමිතීන් ප්‍රකාශයට පත්කළ යුතු බව හා ඒවා පිළිපැදිය යුතු බව.

24. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක සේවා තත්ත්වය නඟා සිටුවීම සඳහා අවම ප්‍රමිතීන් හා කොන්දේසි පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් නියම කළ හැකිය. මෙම නියමයන් චක්‍රලේඛ මඟින් වරින්වර නිකුත් කරනු ලැබිය යුතුය. ළමා සංවර්ධන මධ්‍යස්ථානවල පාලක මණ්ඩලය හා කළමණාකරු එම චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.

ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය වෙනුවෙන් කළමණාකරු කටයුතු කිරීම.

25. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ සියළුම කාර්යයන්ද ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙනුවෙන් ක්‍රියාත්මක කරන වෙනත් කාර්යයන්ද සම්බන්ධයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමඟ කරනු ලබන සියළුම ලිපි ගණුදෙනු ඒ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමණාකරු විසින් පමණක් කළ යුතුය.

ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයක් සිටිය යුතු බව හා ඔවුන්ගේ සුදුසුකම්

26. පාලක මණ්ඩලයට අමතරව ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ රැකවරණය ලබන දරුවන් රැකබලා ගැනීමට කාර්ය මණ්ඩලයක් සිටිය යුතු අතර, ඔවුන්ට පහත සඳහන් සුදුසුකම් අවම වශයෙන් තිබිය යුතුය.

(1) ප්‍රධාන පාලක/පාලිකාව අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටිය අයකු විය යුතුය ;

(2) මනා චරිතයකින් යුක්ත විය යුතුය ;

(3) එම ළමා නිවාසයට අදාළ ආගමිකයෙකු විය යුතුය ;

(4) වගකීම දැරීමට සුදුසු පවුල් පරිසරයක් ඇති අයකු විය යුතුය ;

(5) යහපත් කායික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය ;

(6) මනා පෞරුෂයකින් යුක්ත විය යුතුය.

## III වන කොටස

### ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට ඇතුළත් කිරීම, අධීක්ෂණය, ස්ථාපනය කිරීම, පාලක මණ්ඩලය බල රහිත කිරීම

27. (1) කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව මිස මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට කිසිදු ළමයෙකු ඇතුළත් නොකළ යුතුය. එසේ වුවද සාධාරණ හේතු මත කොමසාරිස්වරයාගේ අනුමැතිය නැතිව ළමයකු ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කිරීමට පාලක මණ්ඩලයට හැකිය. එසේ ඇතුළත් කරගත හැකි ළමුන් සංඛ්‍යාව ළමා සංවර්ධන මධ්‍යස්ථානයට අනුමත ළමයින් සංඛ්‍යාවෙන් 5%ක ප්‍රමාණයක් නොඉක්ම විය යුතුය. එසේ වුවත්, මෙසේ ඇතුළත් කරනු ලබන ළමයින් සම්බන්ධයෙන් සතියක් ඇතුළත දී කොමසාරිස්වරයාගේ ආවරන අනුමැතිය ලබාගත යුතුය ; — ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ළමුන් ඇතුළත් කිරීම.

(2) යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවේදී කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබ ඇති වයස් සීමාවට, ස්ත්‍රී පුරුෂ භාවයට හෝ ආගමික වර්ගීකරණයට පටහැනිව කිසිම ළමයකු ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් නොකළ යුතුය. එසේ ඇතුළත් කරන්නේ නම් එම දරුවාට එම ආයතනය තුළ තම ආගම ඇදහීමට අවස්ථාව ලබා දිය යුතුය.

28. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් යම් ළමයෙකු ස්ථාපනය කිරීම පිළිබඳව සහ ළමුන්ගේ සුභසිද්ධියට අදාළව කළයුතු කටයුතු සම්බන්ධව කොමසාරිස්වරයා විසින් හෝ ස්ථානභාර පරිවාස නිලධාරි විසින් හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථානය අධීක්ෂණය භාරව කටයුතු කරන පරිවාස නිළධාරි විසින් හෝ දෙනු ලබන උපදෙස් හා නියමයන් පිළිපැදීමටත්, ඉටු කිරීමටත්, ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමණාකරු, පාලක මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය කටයුතු කළ යුතුය. — ස්ථාපනය කිරීම හා උපදෙස් පිළිපැදිය යුතු බව.

29. යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවේ දී ඒ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමයින් අනාථ, අත්හල, අසරණ සහ අපයෝජනයට, අපචාරවලට ලක් වූ ගණයට අයත් වේ දැයි පරීක්ෂා කර බලා එක් එක් ළමයා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් සකස් කරනු ලබන වාර්තාවක් එම ළමා සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධව වාර්තා සපයනු ලබන පරිවාස නිලධාරි විසින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. — එක් එක් ළමයා පිළිබඳව වාර්තාවක් පිළියෙල කළ යුතු බව.

30. ඒ ඒ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ අධීක්ෂණයට පරිවාස නිලාධාරියකු පත් කළ යුතුය. පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාට, ළමා සංවර්ධන මධ්‍යස්ථානය අධීක්ෂණය භාර පරිවාස නිලධාරිට, ස්ථානභාර පරිවාස නිලධාරිට සහ කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලබන පරිවාස නිලධාරියකුට සහ කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලබන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරියෙකුට ඕනෑම වේලාවක ළමා සංවර්ධන මධ්‍යස්ථානයට පිවිස පරීක්ෂා කළ හැකිය. එවැනි පරීක්ෂණයකට ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ වෙනත් කිසිදු පුද්ගලයෙකු අවහිර නොකළ යුතුය. — ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය.

සාමාන්‍ය ආරක්ෂාව ලබාදීමේ කටයුතුවලට හැර අභ්‍යන්තර පරීක්ෂාව සඳහා පරිවාස කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව කිසිදු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයක හෝ සංවිධානයක නිළධාරියකු අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුනොකල යුත්තේය.

31. පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක නේවාසිකව සිටින ළමුන් තවදුරටත් රඳවා තබාගැනීම සහ ස්ථාපනය කිරීම කොමසාරිස්වරයාගේ අනුමැතිය අනුව කළ යුතුය. — නේවාසික පහසුකම් සැපයීම.

(1) විසි නව වන වගන්තිය යටතේ ලැබූ යම් වාර්තාවක කරුණු අනුව ඒ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමුන් අත්හල, අසරණ සහ අපයෝජනයට ලක් වූ ගණයට අයත්වන අවස්ථාවකදී කොමසාරිස්වරයා වෙත පූර්ණ දැනුම් දීමක් කොට ඒ ළමයින් ඇතුළත් කළ දින සිට අවුරුදු තුනක උපරිම කාලයක් දක්වා ඒ මධ්‍යස්ථානයේ තබා ගත හැකිය. එසේ වුව ද අවශ්‍යතාවය අනුව කොමසාරිස්වරයාට එකී කාලය දීර්ඝ හෝ කෙටි කළ හැකිය ;

(2) විසි නව වන වගන්තියේ සඳහන් වාර්තා පදනම් පටහැනිව ළමයින් ඇතුළත් කර ගෙන ඇති බව එවැනි ළමුන් නිගමනය කරනු ලබන අවස්ථාව ඔහු විසින් නියම කරනු ලබන ආකාරයට එසේ නියම කළ දින සිට මාස තුනක් ඇතුළත ස්ථාපනය කිරීමට කළමණාකරු විසින් කටයුතු කළ යුතුය ;

(3) ස්ථාපන කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම කළමණාකරු විසින් කටයුතු කළ යුතුය.

තොරතුරු සහ වාර්තා ලබාදීම.

32. කොමසාරිස්වරයාගේ හෝ ස්ථානභාර පරිවාස නිලධාරිගේ හෝ අධීක්ෂණය භාර පරිවාස නිලධාරියාගේ හෝ ලිඛිත දැන්වීමක් මඟින් ඉල්ලා සිටින තොරතුරු හා වාර්තා ඒ දැනුම්දීමේ සඳහන් කාලය ඇතුළත නිවැරදිව ලබාදීමට කළමණාකරු කටයුතු කළ යුතුය.

අවසන් දැන්වීම.

33. විසිහත්වන සහ තිස් එක්වන වගන්ති යටතේ යම් යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමණාකරු, පාලක මණ්ඩලය හා කාර්ය මණ්ඩලය කටයුතු නොකරන අවස්ථාවකදී එම කටයුතු කිරීමට අවසන් දිනයක් නියම කරමින් ලිඛිත දැන්වීමක් ලියාපදිංචි තැපෑලෙන් කළමණාකරු වෙත, පරිවාස කොමසාරිස්වරයා විසින් යැවිය යුතුය. එම නිවේදනයට අනුව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක එයට හේතු දක්වමින් ලිඛිත පැහැදිලි කිරීමක් කළමණාකරු විසින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

කොමසාරිස්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්වීම.

34. කළමනාකරුගේ පැහැදිලි කිරීමක් ලද පසු කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් පත් කරනු ලබන පරිවාස නිලධාරින් දෙදෙනකුගෙන් යුත් මණ්ඩලයක් මඟින් කරනු ලබන පරීක්ෂණයකින් පසුව කොමසාරිස්වරයා විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග වලින් එකක් ගත යුතුය.

(1) තිස් දෙවන වගන්තිය යටතේ නියම කරන ලද කාල සීමාව ඇතුළත විසි හත්වන වගන්තියේ හා තිස් එක්වන වගන්තිය යටතේ කටයුතු කරන ලෙස දන්වමින් අවස්ථාවෝචිත පරිදි ඒ කළමණාකරු හෝ පාලක මණ්ඩලයේ හෝ කාර්ය මණ්ඩලයේ යම් තැනැත්තෙකුට හෝ නියම කළ යුතුය ;

(2) විසිහත්වන වගන්තිය යටතේ දෙනු ලබන උපදෙස් හෝ නියම සම්බන්ධයෙන් ඔහු විසින් කරනු ලබන සංශෝධන වලට යටත්ව ඒ උපදෙස් හෝ නියමයන් පිළිපැදිය යුතු බවට නියම කළ යුතුය ;

නැතහොත්

(3) විසි හත්වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් හෝ ස්ථානභාර පරිවාස නිලධාරි විසින් හෝ අධීක්ෂණය භාර පරිවාස නිලධාරි විසින් හෝ ලබා දී ඇති උපදෙස් පිළිපැදීම හෝ නියම ඉටු කිරීම හෝ අවශ්‍ය නොවන බව හෝ තිස් එක්වන වගන්තිය යටතේ නියම කර ඇති තොරතුරු හෝ වාර්තා හෝ ලබාදීම අවශ්‍ය නොවන බව හෝ දැන්විය යුතුය ;

(4) තිස් දෙවන වගන්තිය යටතේ පැහැදිලි කිරීමක් ලද දින සිට දින තිහක් ඉක්ම යාමට ප්‍රථම පරිවාස කොමසාරිස්වරයා විසින් තම තීරණය පරිවාස නිලධාරිවරයාට පිටපතක් සහිතව කළමනාකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්විය යුතුය.

35. තිස් හතර වන වගන්තිය යටතේ පරිවාස කොමසාරිස්වරයා විසින් දෙනු ලබන තීරණය අවසන් තීරණය වේ.

කොමසාරිස්වරයාගේ තීරණය අවසන් තීරණය බව බලධාරියකු පත් කිරීම.

36. යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක, කළමණාකරු හෝ පාලක මණ්ඩලය හෝ කාර්ය මණ්ඩලය හෝ තිස් දෙවන වගන්තියේ සඳහන් කර ඇති අවසන් දින ඉක්මයාටම පෙර විසි හත්වන වගන්තිය යටතේ දෙන ලද උපදෙස් නොපිළිපදින හා නියම ඉටු නොකරන අවස්ථාවකදී හෝ තිස් එක් වන වගන්තියේ සඳහන් තොරතුරු හෝ වාර්තා ඉදිරිපත් නොකරන අවස්ථාවකදී හෝ තිස් දෙවන වගන්තිය අනුව කටයුතු නොකරන අවස්ථාවක දි හෝ තිස් තුන්වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර පරිවාස කොමසාරිස්වරයා විසින් දෙන ලද තීරණයට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක දී හෝ යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමණාකරු සහ පාලක මණ්ඩලය බල රහිත කොට ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා නිසි බලධාරියකු පත්කිරීමට පරිවාස කොමසාරිස්වරයාට බලය ඇත.

(1) කොමසාරිස්වරයා විසින් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් බල රහිත කිරීමට කටයුතු කරන අවස්ථාවක දී පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියකු නිසි බලධාරියා වශයෙන් පත් කිරීමට ඔහු විසින් පියවර ගත යුතුය.

කළමනාකරුවකු හෝ පාලක මණ්ඩලය ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කටයුතුවලට මැදිහත් නොවිය යුතු බව.

37. කොමසාරිස්වරයා විසින් තිස් හයවන වගන්තිය යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සම්බන්ධව නිසි බලධාරියකු පත් කිරීමෙන් පසු :

(1) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය, කළමණාකරු හෝ කාර්ය මණ්ඩලය එහි කුමන හෝ කටයුත්තකට සහභාගි වීම හෝ සම්බන්ධ වීම නොකල යුතුය.

(2) කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, කළමණාකරු, පාලක මණ්ඩලයේ කිසිවකු සහ කාර්ය මණ්ඩලයේ කිසිවකු ඒ ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටි පරිශ්‍රයට සහ ගොඩනැගිල්ලකට කිසිදු අයුරකින් ඇතුළත් නොවිය යුතුය.

38. තිස් හය වන වගන්තිය යටතේ නිසි බලධාරියකු පත් කළ අවස්ථාවක දී ඒ බව කොමසාරිස්වරයා විසින් කළමණාකරු වෙත ලිඛිතව දැන්විය යුතු අතර, එම ලිපිය ලැබූ වහාම එම ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමණාකරු හෝ පාලක මණ්ඩලය හෝ අධිකාරී බලය ඇති අය හෝ හිමිකරු හෝ කාර්ය මණ්ඩලය හෝ විසින් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සියළුම ලිපි ලේඛන, නිශ්චල හා චංචල දේපල, මුදල් හා බැංකු ගිණුම සමග ආයතනයේ භුක්තිය නිසි බලධාරියා වෙත ලිඛිතව භාරදිය යුතුය. වත්කම් භාර දීම.

39. බල රහිත කරන ලද පාලක මණ්ඩලය සහ කළමණාකරු වෙනුවට නව පාලක මණ්ඩලයක් හා කළමණාකරුවෙකු පත්කිරීම නිසි බලධාරියා පත්කළ දින සිට මාස තුනක් ඇතුළත දී කොමසාරිස්වරයා විසින් සිදු කළ යුතුය. නව කළමණාකාර මණ්ඩලයක් පත් කිරීම.

(1) නව පාලක මණ්ඩලය සහ කළමණාකරුවෙකු පත්කර ගැනීම සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වා ගෙන ගිය සංවිධානයේ සියළුම සාමාජිකයින්ට රැස්වන ලෙස කොමසාරිස්වරයා විසින් ලිඛිතව දන්වා යැවිය යුතුය. එහිදී රහස් ඡන්දයක් මඟින් කළමණාකරුවෙකු හා පාලක මණ්ඩලයක් පත් කර ගත යුතුය ;

(2) මෙම නව කළමණාකරු හා පාලක මණ්ඩලය පත් කිරීමේදී හිටපු කළමණාකරු හෝ පාලක මණ්ඩලය නැවත පත්කර නොගත යුතුය. ඔවුන්ට නැවත නිලතලවලට පත්විය හැක්කේ නව නිලධාරී මණ්ඩලය පත් වී වසර තුනක් ඇවෑමෙන්ය ;

(3) ඉහත පළමු වන උප වගන්තිය යටතේ පත්වන කළමණාකරුට ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සියලුම ලිපි ලේඛන නිශ්චල හා චංචල දේපල සමඟ භුක්තිය ඔහු පත් වී දින හතක් ඇතුළත් දී නිසි බලධාරියා විසින් භාරදිය යුතුය. එසේම භාර ගත් දින සිට ළමා සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යැමට නව කළමණාකරුට හා පාලක මණ්ඩලයට බලය ලැබෙන්නේය ;

(4) ඉහත පළමු වන උප වගන්තිය අනුව කටයුතු ඉටු කර ගැනීමට කොමසාරිස්වරයාට අවකාශ නොලැබී ගියහොත් එය ඉටු කර ගන්නා තෙක් ඉහත දක්වා ඇති තුන් මසක කාලය ඉක්මවා ළමා සංවර්ධන මධ්‍යස්ථානය නිසි බලධාරියා මගින් පවත්වාගෙන යාම සහ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ළමුන් ස්ථාපනය කිරීමේ බලය කොමසාරිස්වරයා සතුවේ.

## **IV** වන කොටස

### භාර ගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානය

40. වයස අවුරුදු හයට අඩු අනාථ, අත්හල සහ අසරණ ළමුන් නේවාසිකව රැකබලා ගැනීම සඳහා භාරගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයක් තිබිය යුතු අතර, එය පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ පාලනය යටතේ විය යුතුය. පළාත් සභාව සතු ළමා සංවර්ධන මධ්‍යස්ථාන තිබිය යුතු බව.

41. අවුරුදු හයකට අඩු ළමයකු අනාථ වී ඇති බව හෝ අත්හරිනු ලැබ ඇති බව යම් තැනැත්තෙකු දැනගත් විගස ඒ බව ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති වෙත හෝ පොලිස් නිලධාරියකු වෙත හෝ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වෙත හෝ ග්‍රාමසේවා නිලධාරියෙකු වෙත හෝ දැනුම් දීමෙන් පසුව බලයලත් යම් නිළධාරියෙකු විසින් රජයේ ආරෝග්‍ය ශාලාවකට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබිය යුතුය. ළමයකු අනාථ වී ඇති බව දැනුම් දිය යුතු බව රෝහලට ඇතුළත් කළයුතු බව.

42. (1) හතලිස් එක්වන වගන්තිය යටතේ ආරෝග්‍යශාලාවකට ඇතුළත් කරනු ලැබූ ළමයෙකුට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමෙන් පසු ඒ ආරෝග්‍යශාලාව භාර වෛද්‍ය නිලධාරියා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් නිළධාරියකු විසින් හෝ කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසු එම ළමයා භාරගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයකට ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. එවැනි දරුවකු විධි වූ පරිදි භාරගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයකට භාරදෙනු ලබන බවට වග බලාගැනීම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේද වගකීමක් වන්නේය. භාරගැනීමේ සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කළයුතු බව.

(2) මෙවැනි ළමයෙකු අපයෝජනයට ලක් වී ඇත්නම් ඒ සම්බන්ධයෙන් අධිකරණ ආඥාවක් අවශ්‍ය වන අවස්ථාවක දී ඒ බව අදාළ පොලිසියට දැන්වීමට ආරෝග්‍යශාලාව භාර වෛද්‍ය නිලධාරි විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධාරියෙකු විසින් හෝ කටයුතු කළ යුතුය.

උපත ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම, පරීක්ෂණ වාර්තාවක් ලබාදිය යුතු බව.

43. (1) ආරෝග්‍යශාලාවක උපත ලැබීමෙන් පසු අනාථ වන හෝ අත්හරිනු ලබන හෝ සෑම ළමයෙකුගේම උපත ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මූලික කටයුතු රෝහලක ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරයා විසින් ළමයා රෝහලින් මුදාහැරීමට ප්‍රථම කළ යුතුය. එම ළමයා භාරගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයට ඇතුළත් කළහොත් ළමයාගේ උපත ලියාපදිංචි කර තිබේදැයි සොයා බලා ලියාපදිංචි වී නොමැති නම් ලියාපදිංචි කරවීමට කටයුතු කිරීම පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ වගකීම වන්නේය.

(2) ආරෝග්‍යශාලාවක් නොවන ස්ථානයකදී අත්හළ ළමයකු සම්බන්ධයෙන් වූ විට එම ළමයා සඳහා උප්පැන්න සහතික පත්‍රයක් නොමැතිව බව සොයා දැනගත් වහාම හෝ එම ළමයාගේ උප්පැන්න සහතිකය සොයා ගැනීමට ක්‍රම වේදයක් නොමැති බව පෙනී ගිය විට එම ළමයාට උප්පැන්න සහතිකයේ සකස් කරදීමට අවශ්‍ය පියවර ගැනීමද, පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ වගකීම වන්නේය.

44. භාර ගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයට ඇතුළත් කරනු ලබන සෑම ළමයෙකු පිළිබඳව විස්තර සහිත වාර්තාවක් කොමසාරිස්වරයා වෙත කොට්ඨාසය භාර පරිවාස නිලධාරියෙකු හෝ කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලබන කොට්ඨාසයේ වෙනත් පරිවාස නිලධාරියෙකු විසින් ලබා දිය යුතුය. එසේම භාර ගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයකට ඇතුළත් කරනු ලබන සෑම ළමයෙකු පිළිබඳවම සම්පූර්ණ විස්තර සහිත වාර්තාව, ඇතුළත් කළ දින සිට දින තිහත් ඇතුළත කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

ස්ථාපන කටයුතු කිරීම.

45. පළාතේ එම සංවර්ධන මධ්‍යස්ථානයට ඇතුළත් කරනු ලබන ළමයින්ගේ ස්ථාපන කටයුතු ස්ථාපන කමිටුවේ නිර්දේශය මත කොමසාරිස්වරයා විසින් කළ යුතුය.

භාරගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයක් සිටීම.

46. හතලිස් වන වගන්තිය අනුව පිහිටුවන ලබන භාරගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය යුතුය.

1. ස්ථානභාර මේට්‍රන්
2. උපමේට්‍රන්
3. නිවාසමාතා
4. පෙරපාසැල් ගුරු
5. අරක්කැමි
6. රියදුරු
7. කම්කරු
8. සනීපාරක්ෂක කම්කරු

ඉදිරියේදී ඇතිවන අවශ්‍යතාවයන් අනුව කාර්ය මණ්ඩලයේ වෙනසක් ඇති කර ගැනීමේ කටයුතු සඳහා අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතියට යටත්ව පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

## V වන කොටස

### වැරදි හා දණ්ඩන

අපයෝජනය අපහරණය නොකළ යුතු බව.

47. (1) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමණාකරු විසින් හෝ පාලක මණ්ඩලයේ යම් තැනැත්තෙකු විසින් හෝ කාර්ය මණ්ඩලයේ යම් තැනැත්තෙකු විසින් හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ භාර ගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයක හෝ සිටින කිසිම ළමයෙකු අපයෝජනය හෝ අපහරණය කිරීම හෝ ඒ සඳහා යම් කෙනෙකුට සහාය වීම හෝ අනුබල දීම හෝ අනුබල දීමට අවකාශ සැලසීම හෝ ඉඩ හැරීම හෝ වරදක් වන්නේය.

වරදක් කරනු ලබන බව හා දණ්ඩනය.

(2) මෙම ප්‍රඥප්තියට යටත් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයාගේ බලතල ක්‍රියාත්මක වන සීමාව තුළ ඊට යටත් සෑම ළමයෙකුම කිසියම් පාර්ශ්වයක් විසින් වානිජමය පරමාර්ථයෙන්, වානිජ දැන්වීමකට යොද ගනු ලබන්නේ නම් එසේ කිරීමට ප්‍රථම දෙමාපියන් වෙතින් හෝ නීත්‍යානුකූල භාරකරුගේ සහ කොමසාරිස්වරයා වෙතින් ලබා ගත් පූර්ව ලිඛිත අවසරය මත පමණක් විය යුත්තේය.

48. (1) ලියාපදිංචි කිරීමට පෙර හෝ ලියාපදිංචි කිරීමෙන් පසුව හෝ යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමණාකරු විසින් හෝ පාලක මණ්ඩලයේ යම් තැනැත්තෙකු විසින් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ කරනු ලැබ ඇති යම් නියමයන් අනුව යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීම පැහැර හැරිය හොත් තමා විසින් සපයනු ලබන යම් වාර්තාවකට හෝ තොරතුරකට හෝ දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් කරන හෝ මෙම ප්‍රඥප්තියේ හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පණවන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ විධිවිධානයක් හෝ උල්ලංඝනය කරන සෑම තැනැත්තෙකුම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලබන්නේය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සඳහා විශේෂ දණ්ඩනයක් නියම කරමින් විධිවිධාන සලසා නොමැති අවස්ථාවක ඒ වරද කරන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පනවනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත් රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොඅඩු හා වසර පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම් යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

(3) ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් හෝ යම් සංවිධානයක් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන අතර එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් මගින් නඩු පැවරිය හැක. එහිදී වරදකරුවකු වන පුද්ගලයකුට, කණ්ඩායමකට හෝ සංවිධානයක සෑම තැනැත්තෙකුටම රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගත කිරීම හෝ ඒ දඩය බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් කළ හැකිය.

(4) පුද්ගල මණ්ඩලයක් විසින් ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලැබූ විට

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙකුම හා නිළධාරියෙක්ම ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙකුම ;

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය ළමා සංවර්ධන මධ්‍යස්ථානය පාලනය කරන පාලක මණ්ඩලයක් නම් එහි සෑම සාමාජිකයෙකුම.

ඒ වරදට වරදකරු වන්නේය. එසේ වුවද එම වරද සිදුකරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව හෝ මෙම සිදුකිරීම වැළැක්වීම සඳහා තමා නිසි සියළු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හෝ නිළධාරිවරයෙකු විසින් හෝ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවෙකු විසින් හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් හෝ ඔප්පු කරනු ලැබුවහොත් ඔහු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතුය.

(5) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකරණයෙක් මගින් වරදකරුවකු ලෙස තීරණය කරනු ලබන ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයක කළමණාකරුවෙකුට, පාලක මණ්ඩලයේ සාමාජිකයකුට කාර්ය මණ්ඩලයේ තැනැත්තෙකුට ඉදිරියේදී කිසිම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක නිලයක්, තනතුරක් හෝ කළමණකාර තනතුරක් දැරිය නොහැකි වන්නේය.

## **VI** වන කොටස

### මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම හා විගණනය

49. (1) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතනවලට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභාවේ වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන වලින්ද ඇස්තමේන්තු මගින් හා ආධාර හා ප්‍රදාන මගින් ලැබෙන ප්‍රතිපාදන වලින් සමන්විත වන්නේය. අරමුදල් සැපයීම.

(2) මෙම ප්‍රඥප්තියට අදාල විගණන කටයුතු සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ සඳහන් විධිවිධාන අදාල වන්නේය.

## VI වන කොටස

### පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ සංයුතිය හා බලතල

කාර්ය මණ්ඩලය.

50. කොමසාරිස්වරයාට සහාය පිණිස ප්‍රමාණවත් පරිවාස නිලධාරීන් ඇතුළු අදාළ කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය.

බලතල පැවරිය හැකි බව.

51. මෙම ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කිරීමේදී කොමසාරිස්වරයා සතු බලතල හා කර්තව්‍යයන් ඉටුකිරීම පරිවාස නිලධාරින් වෙත ලිඛිතව පැවරිය හැකිය.

නඩත්තු ආධාර ගෙවීම.

52. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන සෑම සංවර්ධන පළාත් මධ්‍යස්ථානයක රැකවරණය ලබන ළමයකු වෙනුවෙන් ගණනය කරනු ලබන නඩත්තු ආධාර මුදලක් ගෙවිය යුතු අතර ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කළ දිනයේ සිට මාස දොළහක් ගතවන තෙක් නඩත්තු ආධාර ලැබීම සඳහා හිමිකමක් නොමැත.

(2) මෙම නඩත්තු ආධාර මුදල කලින් කලට සංශෝධනය කිරීමේ බලය.

යථායෝග්‍ය ආධාර ගෙවීම.

53. මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ගොඩනැගිලි තැනීම හා උපකරණ ලබා ගැනීම සඳහා යථායෝග්‍ය ආධාර මුදලක් ගෙවිය හැකිය.

වාර්ෂික ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කළයුතු බව.

54. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන සංවිධානයක, අර්ධ රාජ්‍ය ආයතනයක හෝ රාජ්‍ය ආයතනයක මහා සභා රැස්වීමක දී බහුතරයකගේ ඡන්දයෙන් වාර්ෂිකව පත් කරනු ලබන කළමණාකරු විසින් ළමා සංවර්ධන මධ්‍යස්ථානයට අදාළව වාර්ෂිකව ගිණුම් ප්‍රකාශයක් සකස් කළ යුතු අතර, කළමණාකරු විසින් එම ප්‍රකාශය ඊළඟ වසරේ ජනවාරි තිස් එක්වන දිනට ප්‍රථම කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

රෙගුලාසි පැනවීම.

55. මෙම ප්‍රඥප්තියට අදාළ රෙගුලාසි පැනවීමට අමාත්‍යවරයාට බලය ඇත. මෙම ප්‍රඥප්තිය යටතේ පහත සඳහන් කාරණා ද ඇතුළුව ප්‍රඥප්තියේ අරමුණ යටතට ගැනීමට හැකි කාරණාවක් සම්බන්ධයෙන් වුවද අමාත්‍යවරයා විසින් රෙගුලාසි පැනවිය හැකිය.

(1) ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතීන් තීරණය කිරීම.

(2) ළමා සංවර්ධන මධ්‍යස්ථාන විසින් මධ්‍යස්ථාන වලට අදාළව හා නේවාසිකයන්ට අදාළව ගිණුම් පවත්වාගෙන යාම.

56. අමාත්‍යවරයා විසින් පනවන ලද සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කරන අතරම හැකිතාක් කඩිනමින් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

57. පළාත් සභාව විසින අදාළ රෙගුලාසි අනුමත කිරීම සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම සිදුකළ හැකි අතර ඒ සම්බන්ධයෙන් වන නිවේදනයක් ගැසට් පත්‍රයක් මඟින් පල කළ යුතුය.

58. අමාත්‍යවරයා විසින් පනවන රෙගුලාසියක් පළාත් සභාව විසින් අනුමත කිරීම, සංශෝධනය කිරීම හා පරිච්ඡින්න කිරීමේදී එම රෙගුලාසි යටතේ එතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවිය යුතුය.

අර්ථ නිරූපනය.

59. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම ප්‍රඥප්තියේ

"පාළත් සභාව" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාව අදහස් වේ ;

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

"ලේකම්වරයා" යන්නෙන් තත්කාලයේ දී ඌව පළාතේ පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ ;

"කොමසාරිස්වරයා" යන්නෙන් ඌව පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා අදහස් වේ ;

"පරිවාස නිලධාරියා" යන්නෙන් 1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස භාරයට ගැනීමේ ආඥා පනතේ දහ හත්වන වගන්තිය අනුව පත් කරන ලද නිලධාරියෙකු අදහස් වේ ;

"නිසි බලධාරයා" යන්නෙන් ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා විසින් පත් කරනු ලබන ඌව පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරියෙකු අදහස් වේ ;

"භාර ගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානය" යන්නෙන් අනාථ, අත්හල, අසරණ සහ අපයෝජනයට ලක් වූ ළමුන් නේවාසිකව රැකබලා ගැනීම සඳහා ඌව පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන ආයතනයක් අදහස් වේ ;

"ළමා සංවර්ධන මධ්‍යස්ථානය" යන්නෙන් අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමයින් භාර ගැනීම ඔවුන් නේවාසිකව තබා ගැනීම, ඔවුන්ට භාරය හා ආරක්ෂාව සැපයීම සඳහා ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන මඟින් පවත්වාගෙන යනු ලබන සියළු ආකාරයේ ආයතන නිවාස හා සංවර්ධන මධ්‍යස්ථාන සහ අධිකරණ මඟින් යොමු කරනු ලබන්නා වූ අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමයින්, ගර්භනී ළමයින් හා ළමා මව්වරුන් භාර ගැනීම, ඔවුන් නේවාසිකව තබා ගැනීම, ඔවුන්ට භාරය හා ආරක්ෂාව සැපයීම සඳහා ස්වේච්ඡා සංවිධාන මඟින් පවත්වාගෙන යනු ලබන සියළු ආකාරයේ නිවාස හා මධ්‍යස්ථාන අදහස් කෙරේ ;

"ස්වේච්ඡා සංවිධාන" යන්නෙන් 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත හා ඊට අදාළ 1998 අංක 08 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) (සංශෝධන) පනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සංවිධානයක් අදහස් වේ ;

"අනාථ" යන්නෙන් නීත්‍යානුකූලව විවාහ වූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් දෙමව්පියන් මිය ගිය හෝ නීත්‍යානුකූලව විවාහ නොවූ දෙමපියන්ට උපන් ළමයෙක් නම් මව මියගිය ළමයෙකු අදහස් වේ ;

"අත්හල" යන්නෙන් නීත්‍යානුකූලව විවාහ වූ දෙමාපියන්ට උපන් ළමයෙක්, ඔවුන් දෙදෙනා විසින් අත්හල හෝ නීත්‍යානුකූලව විවාහ නොවූ දෙමාපියන්ට උපන් ළමයෙන් නම් මව විසින් අත්හල ළමයෙකු අදහස් වේ ;

"අසරණ" යන්නෙන් මව හෝ පියා හෝ මියගිය, දෙමාපියන්ගෙන් එක් අයෙක් විසින් අත්හැර දමනු ලැබූ හා අනෙක් තැනැත්තා දෙමාපියෙකු ලෙස කටයුතු කළ නොහැකි, භාරය හා ආරක්ෂාව අවශ්‍ය, රජයේ දෙපාර්තමේන්තුවක් මඟින් හෝ පළාත් පාලන ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලබන මහජන සහනාධාර ලබන දෙමව්පියන්ගේ, දෙමව්පියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් අනුව අදායම් මාර්ගයක් ලබාගත නොහැකි රෝගී තත්ත්වයක සිටින හා අනෙක් තැනැත්තා/තැනැත්ති (මව හෝ පියා හෝ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති, දෙමව්පියන්ගෙන් කෙනෙකු බන්ධනාගාර ගතව සිටින හා අනෙත් තැනැත්තා/තැනැත්තිට (මව හෝ පියා හෝ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති, දෙමව්පියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් මත මානසික රෝගියෙකු යැයි නිශ්චය කර ඇති සහ අනෙක් තැනැත්තා/තැනැත්තිට (මව හෝ පියාගේ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති උසාවි නියෝගයක් මත හෝ වෙනත් ආකාරයකින් දෙමාපියන් වෙන් වූ පවුලක ළමුන්ගේ භාරකාරත්වය දරන මවට හෝ පියාට හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නැති, ළමයෙකු අදහස් වේ ;

"අපයෝජනය" යන්නෙන්

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ 286 අ, 288. 288 අ, 288 ආ, 308 අ, 360 ආ, 360 ඇ, 363, 364 අ, 365 අ හා 365 ආ වගන්තිවල කවර හෝ විධිවිධානයක් ;

(ආ) ස්ත්‍රී තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනතේ කවර හෝ විධිවිධානයක් ;

(ඇ) ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ කවර හෝ විධි විධානයක් ;

(ඈ) අධ්‍යාපන ආඥා පනත යටතේ සාදන ලද අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝගවල කවර හෝ විධි විධානයක්.

"අපහරණය" යන්නෙන් (15 වන අධිකාරය) දණ්ඩ නීති සංග්‍රහයේ දැක්වෙන අර්ථය ඇත්තේය ;

"ස්ථාපනය" යන්නෙන් ළමා සංවර්ධන මධ්‍යස්ථානය හෝ භාර ගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයක නේවාසික ළමයෙකු දෙමාපියන් වෙත හෝ භාරකරුවන් වෙත හෝ ඥාතියෙකු වෙත හෝ භාරදීම වෙනයම් ආකාරයකින් ළමයාගේ සුභසිද්ධියට අදාළ වන පරිදි සමාජයට අන්තර්ග්‍රහණය කිරීම අදහස් වේ ;

"ස්ථාපන කමිටුව" යන්නෙන් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක නම් එහි කළමණාකරු, ප්‍රධාන පාලක, අදාළ ළමුන්ගේ දෙමාපියන්, භාරකරුවන්, ස්ථානභාර පරිවාස නිලධාරින්, ළමා සංවර්ධන මධ්‍යස්ථානය අධීක්ෂණය කරනු ලබන පරිවාස නිලධාරින්, කොමසාරිස් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගෙන් සමන්විතව පැවැත්වෙන රැස්වීමක් අදහස් වේ. භාර ගැනීමේ ළමා සංවර්ධන පළාත් මධ්‍යස්ථානයක නම් පළාත් කොමසාරිස්, මෙිට්‍රන් එම ළමා සංවර්ධන මධ්‍යස්ථානය අසළ පිහිටි පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිළධාරි, ළමා සංවර්ධන මධ්‍යස්ථානයට අනුයුක්ත පරිවාස නිලධාරින්, දෙමාපියන්ද, භාරකරුවන්ද කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරින්ගෙන් ද සමන්විතව පැවැත්වෙන රැස්වීමක් අදහස් වේ ;

"කළමනාකරු" යන්නෙන් කිසියම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක පාලන කටයුතු භාරව ක්‍රියාකරන එම මධ්‍යස්ථානයේ හිමිකරු හෝ පාලක හෝ වෙනත් තැනැත්තෙකු අදහස් වේ ;

සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

60. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## පළමුවන උපලේඛනය

ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

........................................... පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විධිවිධාන යටතේ ......................................................දිස්ත්‍රික්කයේ .................................................... ස්ථානයේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අවසර ඉල්ලීම.

(i) යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නම : ........................................................................................

(ii) ලිපිනය හා දුරකථන අංකය : ..................................................................................................................

(iii) ළමා සංවර්ධන මධ්‍යස්ථානය ආරම්භ කර පවත්වා ගෙන යාමට අපේක්ෂා කරන ස්වේච්ඡා සංවිධානයේ නම : ..................................................................................................

(iv) එය සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ පිළිගත් සංවිධානයක ලියා පදිංචිය පිළිබඳව විස්තරය (ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න) : .................................................................................................

(v) ස්වේච්ඡා සංවිධානයේ අරමුණ : ..............................................................................................................
.................................................................................................................................................................
(ව්‍යවස්ථා පිටපතක් මේ සමඟ යා කරන්න)

(vi) මෙම සංවිධානයේ ව්‍යුහය :

නිලධාරි මණ්ඩලය

| | නම ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| ගරු සභාපති | ...................................................... | .................................................... |
| ගරු ලේකම් | ...................................................... | .................................................... |
| ගරු භාණ්ඩාගාරික | ...................................................... | .................................................... |
| අනුශාසක | ...................................................... | .................................................... |

(vii) ස්වේච්ඡා සංවිධානයේ වත්කම් :

| | *මූල්‍ය බැංකු ශාඛා* | *ගිණුම් අංකය* | *දැනට ඇති වත්කම්* |
|---|---|---|---|
| 01. | ...................................................... | ...................................................... | ...................................................... |
| 02. | ...................................................... | ...................................................... | ...................................................... |
| 03. | ...................................................... | ...................................................... | ...................................................... |

වෙනත් විදයම්

(වාහන, ඉඩම්, ගොඩනැගිලි ව්‍යාපාර .............................................................................................. යනාදිය පිළිබඳ විස්තර සපයන්න)

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

(viii) ස්වේච්ඡා සංවිධානයට විදේශ ආධාර ලබාදෙන ආයතන හා ආධාර ප්‍රමාණය :

| *ආයතනය* | *වාර්ෂිකව ලබා දෙන ආධාර ප්‍රමාණය* |
|---|---|
| ............................................................ | ................................................................... |
| ............................................................ | ................................................................... |
| ............................................................ | ................................................................... |
| ............................................................ | ................................................................... |

(ix) ස්වේච්ඡා සංවිධානයේ ගිණුම් කටයුතු කරනු ලබන්නේ කවුරුන් විසින්ද? :

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

02.

(i) ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අදහස් කරන කළමණාකරණ මණ්ඩලයේ විස්තර ?

| *නම හා තනතුර* | *වයස* | *ලිපිනය* | *දුරකථන අංකය* |
|---|---|---|---|
| ...................................................... | ..................... | ....................................................... | .............................................. |
| ...................................................... | ..................... | ....................................................... | .............................................. |
| ...................................................... | ..................... | ....................................................... | .............................................. |
| ...................................................... | ..................... | ....................................................... | .............................................. |
| ...................................................... | ..................... | ....................................................... | .............................................. |
| ...................................................... | ..................... | ....................................................... | .............................................. |

(ii) මෙම සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේදී යෙදවීමට අපේක්ෂා කරන කළමණාකරුගේ යෝග්‍යතාවය :

(*a*) නම : ..........

(*b*) උපන් දිනය : ..........

(*c*) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් : ..........

..........

..........

(*d*) වෘත්තීය පළපුරුද්ද : ..........

..........

..........

(iii) යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ගිණුම් කටයුතු කරනු ලබන්නේ කවුරුන් විසින්ද ?

..........

03. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ රැකවරණය ලබා දීමට අදහස් කරන්නේ

(*a*) පිරිමි දරුවන්ද/ගැහැනු දරුවන්ද/මිශ්‍රද : ..........

(*b*) ළමුන්ගේ වයස් සීමාව : ..........

(*c*) අපේක්ෂිත ළමුන් සංඛ්‍යාව : ..........

(ii) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට යෙදවීමට අපේක්ෂිත සේවක සංඛ්‍යාව :

..........

(එක් එක් සේවාවන්ට යොදවා ගැනීම පිළිබඳ විස්තර) :

..........

..........

| නම | තනතුර | වයස | අධ්‍යාපන/වෘත්තීනය සුදුසුකම් | පලපුරුද්ද |
|---|---|---|---|---|
| .......... | .......... | .......... | .......... | .......... |
| .......... | .......... | .......... | .......... | .......... |
| .......... | .......... | .......... | .......... | .......... |
| .......... | .......... | .......... | .......... | .......... |
| .......... | .......... | .......... | .......... | .......... |
| .......... | .......... | .......... | .......... | .......... |
| .......... | .......... | .......... | .......... | .......... |

යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙනුවෙන් ගොඩනැගිලි ඉදිකිරීමට අදහස්කර/ඉදිකර ඇති භූමිය සංවිධානය සතුද (සංවිධාන සතුනම් අදාල විස්තර හා ඔප්පුවේ සහතික කළ පිටපතක් අමුණන්න)

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

(ii) යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ඉඩ පහසුකම් කාමර ඇතුළු අනෙකුත් ශාලාවන් පිළිබඳ විස්තර (ගොඩනැගිලි බිම් සැලැස්මක් ඇමිණිය යුතුය) :

| | දිග | පළල |
|---|---|---|
| (a) නිදන කාමර | | |
| (b) අධ්‍යාපන කටයුතු වල නිරතවීමට සුදුසු ශාලාව | | |
| (c) විවේක ගැනීමට සුදුසු ශාලාව | | |
| (d) අමුත්තන් මුණ ගැසීමේ ශාලාව | | |
| (e) කාර්යාලය | | |
| (f) රෝගීන් සඳහා වෙන් කර ඇති කාමර | | |
| (g) ප්‍රතිකාරාත්මක වැඩසටහන් සඳහා වෙන් කර ලද කාමරය | | |
| (h) මුළුතැන්ගෙය | | |
| (i) සේවකයින්ගේ නේවාසික කාමර | | |
| (j) ගබඩා කාමර | | |
| (k) නාන කාමර | | |
| (l) වැසිකිළි ප්‍රමාණය | | |
| (m) ගැනීමට සපයා ඇති ඉඩ පහසුකම් | | |
| (n) එළිමහනේ ක්‍රීඩා සඳහා ඉඩකඩ ප්‍රමාණය | | |
| (o) ළමා සංවර්ධන මධ්‍යස්ථානයට අවශ්‍ය ජලය සපයා ගන්නා ක්‍රම | | |
| (p) ප්‍රධාන විදුලිය ලබන්නේද? | | |

(i) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ළමුන්ට විධිමත් අධ්‍යාපනය ලබාදීමට අදහස් කරන පාසල් පිළිබඳ විස්තර :

| පාසලේ නම | ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ඇති දුර |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(ii) ළමා සංවර්ධන මධ්‍යස්ථානය තුළදී ලබා දීමට අපේක්ෂිත පහසුකම් :

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

05.

(i) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමුන්ට සෞඛ්‍ය පහසුකම් ලබන්නේ කෙසේද?
ළඟම ඇති රෝහලට ඇති දුර ප්‍රමාණය සඳහන් කරන්න :

.............................................................................................................................................................
.............................................................................................................................................................

(ii) ළමා සංවර්ධන මධ්‍යස්ථානය ආරම්භ කිරීමට නියමිත ප්‍රදේශයේ පරිසරයේ ස්වභාවය හා අවට පදිංචි ජන කොට්ඨාසයේ ස්වභාවය නාගරික/අර්ධ නාගරික/ගම්බද ?

.............................................................................................................................................................
.............................................................................................................................................................
.............................................................................................................................................................
.............................................................................................................................................................

(iii) ළඟම ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ඇති දුර/එම ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිරිමි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්ද/ගැහැණු ළමා මධ්‍යස්ථානයක්ද/මිශ්‍ර මධ්‍යස්ථානයක්ද ?

.............................................................................................................................................................
.............................................................................................................................................................

(iv) ආගමික වතාවත් සඳහා ඇති පහසුකම් :

.............................................................................................................................................................
.............................................................................................................................................................

06. ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ඇතුළත් කරන ළමුන් නැවත සමාජ ගත කිරීමට/පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂිත ක්‍රමවේදයක් (ළමුන් ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ගත කළ පසු දීර්ඝ කාලීනව ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ රඳවා තැබීම නොකරන අතර, හැකි ඉක්මණින් පුනරුත්ථාපනය කර දෙමාපිය/භාරකරුවන් වෙත භාරදිය යුතුය) මෙම ක්‍රම වේදයන් සවිස්තරව සඳහන් කළ යුතුය :

.............................................................................................................................................................
.............................................................................................................................................................
.............................................................................................................................................................
.............................................................................................................................................................

තවද, 1980 සංශෝධිත ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත අණ පනත් සංග්‍රහයේ xiv වෙළුමේ 369 වැනි ඡේදය මත අනත්දරු නිවාස ආඥා පනතේ නියමයන් අනුව අනත්දරු නිවාස ලියා පදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා .......................................................................... පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇති නිකුත් කරනු ලබන උපදෙස් හා විධි විධාන වලට අනුකූලව කටයුතු කරනු ලබන බවද, සහතික සහතික කරමි. එමෙන්ම, මා දන්නා පරිදි මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති සියලු තොරතුරු සත්‍ය බවට හා නිවැරදි බවටද සහතික කරමි.

| | | |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |
| ගරු සභාපති | ගරු ලේකම් | ගරු භාණ්ඩාගාරික |
| දිනය | දිනය | දිනය |

## දෙවන උපලේඛනය

.................................... පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලියා පදිංචි කිරීම.

01. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නම :

02. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ලිපිනය :

03. නව ලියාපදිංචි අංකය හා දිනය :

04. අනුමත ළමුන් සංඛ්‍යාව : ගැහැණු/පිරිමි

05. පෙර ලියාපදිංචි අංකය සහ දිනය (ඇත්නම්) :

06 ළමා සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධානයේ නම :

............................................................... ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලියා පදිංචි කිරිමේ මෙම සහතිකය පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා විසින් කලින් කල නිකුත් කරන ලද අනෙකුත් සියලුම උපදෙස් හා විධිවිධානවලට අනුකූලව නිකුත් කරනු ලබන බවද, පෙර ලබාදී ඇති ලියාපදිංචි අංකය හා දිනය අහෝසි කර, ඉහත දක්වා ඇති නව ලියාපදිංචි අංක හා දින දරන ඉහත ළමා සංවර්ධන මධ්‍යස්ථානය ................................................................... පළාත් බන ප්‍රදේශයේ පරිවාස හා ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස් වන ........................................................ මා විසින් ලියාපදිංචි කරන ලද බවට සහතික කරමි.

ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන රෙජිස්ට්‍රාර් සහ
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්, ඌව පළාත.

දිනය :

## තුන්වන උපලේඛනය

ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සේවා තත්ත්වය නගා සිටුවීම සහ පොදු ප්‍රමිති නියම කිරීම

**01. ගොඩනැගිලි ඉඩකඩ හා වටපිටාව පිළිබඳ ප්‍රමිතීන්**

1.1 එක් ළමයකුට අවම වශයෙන් වර්ග අඩි 36ක් වන පරිදි නිදා ගැනීමේ ඉඩකඩ ද සෑම ළමයෙකුටම ඇඳක් සහ සෑම ඇඳකටම මදුරු දැලක්ද තිබිය යුතුය.
අවශ්‍යතාවය අනුව විදුලි ඇඳ ලාම්පුවක් තිබිය යුතුය.

1.2 ආහාර අනුභවයට, පාඩම් කිරීමට, විවේක ගැනීමට, අමුත්තන් මුණ ගැසීමට උපරිමයෙන් ළමයින් සංඛ්‍යාවකට සරිලන පරිදි ඉඩකඩ, නිදා ගැනීමේ ඉඩකඩ වලට අමතරව ගොඩනැගිලි වල තිබිය යුතුය. පාඩම් කරන අවස්ථාවේ ඒ සඳහා යොදා ගැනීමට මේස හා පුටු තිබිය යුතුය. ඒ සෑම ස්ථානයක්ම පිරිසිදු කර තිබිය යුතුය. අවශ්‍ය නම් පිරිසිදු කිරීම සඳහා විෂබීජ නාශක යෙදිය යුතුය.

1.3 නිවාසයකට අවශ්‍ය හිරු එළිය හා වාතාශ්‍රය ලැබීම සඳහා දොර ජනෙල් වර්ග ප්‍රමාණයෙන් 1/7 වන පරිදි තිබිය යුතුය.

1.4 සේවකයින්ට අවශ්‍ය ඉඩකඩ වෙනම තිබිය යුතුය. අමතරව රාත්‍රී කාලයේ ළමුන්ගේ අවශ්‍යතාවයන් සොයා බැලීමට පහසුවන පරිදි පාලක/මවගේ/පියාගේ/කාමරය ළමුන්ගේ නේවාසිකාගාරයට/කාමරයට ආසන්නව තිබිය යුතුය.

1.5 ගොඩනැගිලි පිරිසිදුවත්, අලංකාරවත් තබා ගත යුතුය. අවට ගෙවත්ත නිවාසයට ප්‍රයෝජනවත් පරිදි හා සිත්ගන්නා අන්දමට පවත්වා ගෙන යා යුතුය.

1.6 නිවාසයේ අවශ්‍යතාවයකට සෑහෙන පරිදි ජලය සැපයීමේ විධි විධාන තිබිය යුතුය. තවද, ළමුන්ට මුහුණ සේදීමට පහසුවන පරිදි ළමුන්ගේ උස ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන සෝදන බේසම් සවිකර තිබිය යුතුය.

1.7 ජලය සපයනු ලබන්නේ ළිඳකින් නම්, එය වටා බැම්මකින් හා දැලකින් ආවරණය කර ආරක්ෂා සහිතව සකස් කර තිබිය යුතුය.

1.8 ළමුන්ට හා සේවකයින්ට ආරක්ෂාව සහ රැකවරණය ඇතිව නැමට පහසුකම් තිබිය යුතුය. ඒ හැර නාන කාමර හා වැසිකිළි වෙන වෙනම තිබීම අවශ්‍ය වේ.

1.9 සෑම නේවාසිකයන් 08 දෙනෙකුටම එක වැසිකිළියක් බැගින් තිබිය යුතු අතර, ඒවා සහ කාණු විෂබීජ නාශක යොදා ශුද්ධ පවිත්‍ර කිරීමට විධිවිධාන යොදා තිබිය යුතුය.

1.10 මුළු නිවාසයේම අවශ්‍යතාවනට සෑහෙන පරිදි රාත්‍රි ආලෝකය සැපයිය යුතුය. ඉන්ධන යොදා ලාම්පු මඟින් ආලෝකය ඇත්හිටවූ අවස්ථාවක පමණක් කළ යුතු අතර, එසේ භූමිතෙල් හෝ වෙනත් ඉන්ධන යොදා පාවිච්චි කරන ලාම්පු ආරක්ෂා සහිත විය යුතුය.

1.11 විදුලි වයර් සහ කේබල් ආරක්ෂිත ලෙස ආවරණය කර තිබිය යුතුය.

1.12 සියළුම ගිනි ගන්නා සුළු ද්‍රව්‍යයන් ළමුන්ට ප්‍රවේශ විය නොහැකි ස්ථාන වල ආරක්ෂා සහිතව ගබඩා කර තිබිය යුතුය.

**02. ආහාර පාන පිළිබඳ ප්‍රමිතීන්**

2.1 නේවාසිකයින්ට සපයන ආහාර ඔවුන්ගේ වයසට හා සෞඛ්‍ය තත්ත්වයට අවශ්‍ය පරිදි සමබර හා පෝෂ්‍යදායි සහ නියමිත ප්‍රමාණයන්ගෙන් යුක්ත විය යුතුය.

2.2 ඒ ඒ වයස් ප්‍රමාණ අනුව සටහන් සකස් කර තිබිය යුතුය.

2.3 එදිනෙදා දෙනු ලබන ආහාර වර්ග සහ ප්‍රමාණය දැක්වෙන ලේඛනයක් තබාගත යුතුය.

2.4 යටත් පිරිසෙයින් සතියකට අවශ්‍ය වන හාල්, පොල්, සීනි, පිටි හා තුනපහ ආදියත් 03කට සෑහෙන එළවලුත් හැම විටම ගබඩා කර තිබිය යුතුය.

2.5 පාසල් යන ළමුන්ට පාසලේදී අනුභව කිරීම සඳහා අතිරේක ආහාර වේලක් සකස් කර දිය යුතුය. එසේ නොමැති අවස්ථාවල එක් එක් ළමයාට වෙන වෙනම අතිරේක ආහාර වේල ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් මුදලක් අතට ලබාදිය යුතුය. කෙසේ වුවද ළමුන් අතට මුදල් ලබාදීම නිරන්තරයෙන් සිදු නොවිය යුතුය.

**03. ළමුන්ගේ ඇඳුම් පිළිබඳ ප්‍රමිතීන්**

3.1 සෑම ළමයෙකුටම ඇඳ ඇතිරිලි කට්ටලයක්, පොරෝන, තුවා, දත් බුරුසු, දත් බෙහෙත් සෑහෙන පරිදි සපයා තිබිය යුතුය. තවද, සෑම ගැහැණු ළමයකුටම අවශ්‍යතාව පරිදි සනීපාරක්ෂක තුවා සපයා දිය යුතුය.

3.2 සෑම ළමයකුටම නිවාසයේදී ඇඳීමට ඇඳුම් කට්ටල 02ක් ද, පාසලට යන ළමයකුට පාසල් ඇඳුම් කට්ටල 03ක්ද, උත්සව අවස්ථාවන්ට ඇඳීමට සුදුසු හොඳ තත්ත්වයේ ඇඳුම් කට්ටලයක්ද අඩු වශයෙන් තිබිය යුතුය.

3.3 සෑම පිරිමි හා ගැහුණු ළමයකුටම අවම වශයෙන් කට්ටල තුන බැගින් යට ඇඳුම් ලබාදිය යුතුය.

3.4 ළමුන්ට සපයන සියලුම ඇඳ ඇතිරිලි, තුවා, පොරෝන සහ ළමුන්ගේ ඇඳුම් ඩෙටොල් වැනි විෂබීජ නාශක යොදා පිරිසිදු කර තිබිය යුතු අතර, ගැහැණු ළමුන්ට ලබාදෙනු ලබන සනීපාරක්ෂක තුවා පාවිච්චියෙන් පසු ඉවත් කිරීමට සුදුසු ක්‍රමයක් සකසා තිබිය යුතුය.

**04. උපකරණ පිළිබඳ ප්‍රමිතීන්**

(අ) ගෘහ භාණ්ඩ

4.1 අවුරුදු 06න් ඉහළ සෑම ළමයකුගේම, ඇඳුම් පොත්පත් ආදි පෞද්ගලික භාණ්ඩ හා උපකරණ තබා ගැනීමට වෙනම කබඩ් එකක් බැගින් තිබිය යුතුය.

4.2 අවුරුදු 06ත් පහළ ළමුන්ගේ ඇඳුම් හා අනෙකුත් උපකරන තබා ගැනීම සඳහා පොදු වශයෙන් අල්මාරි තිබිය යුතුය.

4.3 නේවාසික ළමුන්ට ආහාර ගැනීමට හා/හෝ කියවීම් ශාලාවට අවශ්‍ය මේස සහ පුටු සෑහෙන පරිදි තිබිය යුතුය. ආහාර ගැනීම සඳහා අඩුතරමින් ළමුන් 08 දෙනෙකුට එක් මේසයක් වන සේ මේසද, වාඩිවීමට සුදුසු ආසන ද තිබිය යුතුය.

4.4 සෑම ළමයකුටම කෝප්පයක්, පිඟානක් සහ අවශ්‍ය නම් ආහාර ගැනීම සඳහා වෙන්වූ හැන්දක් තිබිය යුතුය.

4.5 පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරදි ළමුන්ගේ පිඟන් කෝප්ප සේදීමට පහසුකම් සලස්වා තිබිය යුතුය.

4.6 අවශ්‍යතාව පරිදි ළදරුවන් සඳහා කිරි බෝතල හා අවශ්‍ය සාප්පු වෙන් වෙන්ම තිබිය යුතුය.

(ආ) මුළුතැන්ගෙය

4.7 සියලුම නේවාසිකයින්ට හා නිලධාරින්ට සෑහෙන පොදු බඩු මුට්ටු සහ කුස්සියට අවශ්‍ය උපරකණ තිබිය යුතුය.

4.8 දර, ගෑස් හෝ විදුලිය මුළුතැන්ගෙයි කටයුතු සඳහා පාවිච්චි කළ හැකි අතර, ඒවා පාවිච්චියට ගන්නා ආකාරය අනුව ඒ සඳහා වෙන වෙනම ස්ථාන සකසා ගත යුතුය.

(ඇ) අධ්‍යාපනික උපකරණ

4.9 ළමයින් යන පාසල් වලින් නියම කරනු ලබන පොත් පත් හා උපකරණ ළමයින්ට සපයා තිබිය යුතුය.

4.10 ළමයින්ට, විවේක කාලයේ කියවීමට අවශ්‍ය පරිදි පුස්තකාල පහසුකම් තිබිය යුතුය.

4.11 දිනපතා පලවෙන පුවත්පතක්/පුවත්පත් හා සතිපතා නිකුත් වන ළමා පුවත්පතක් සැපයීමට විධිවිධාන යොදා තිබිය යුතුය.

4.12 විනෝදාත්මක කටයුතුවලට අවශ්‍ය වන උපකරණ ළමුන්ට ප්‍රමාණවත් වන පරිදි සපයා තිබිය යුතුය.

(ඈ) ළමුන්ගේ සහජ ලැදියාවන්ට අනුකුල සහ විවේක කාලය ප්‍රයෝජනවත්ව ගත කිරීමට අවශ්‍ය උපකරණ

4.13 ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පහත දැක්වෙන, උපකරන සපයා තිබිය යුතුය.

(i) ගුවන් විදුලි යන්ත්‍රයක් ;

(ii) රූපවාහිනි යන්ත්‍රයක් (වර්ණ අඟල් 24) ;

(iii) සංගීත භාණ්ඩ ;

(iv) අවුරුදු 05ත් පහළ ළමුන් සඳහා කැබලි ප්‍රහෙළිකා, ඉදිකිරීම් කැබලි වැනි ක්‍රීඩා උපකරණ ;

(v) ළමුන්ගේ රුචිකත්වය අනුව විවේක කාලය ගත කිරීමට, දාම් ලෑලි, චෙස් ක්‍රීඩා උපකරණ, කැරම් බෝඩ්, රබර් බෝල වැනි උපකරණ හා භාණ්ඩ.

(ඉ) ක්‍රීඩා පහසුකම්

4.14 සෑම නිවාසයකම නේවාසික ළමුන්ට සරිලන පරිදි බාහිර ක්‍රීඩා කිරීමට ක්‍රීඩා පිටියක් තිබියු යුතුය.

4.15 නිවාසය සතුව ක්‍රීඩා පිටියක් නොමැතිනම්, පිටස්තරව ඇති පොදු හෝ පාසල් ක්‍රීඩාංගනයක් ප්‍රයෝජනයට ගැනීමට විධිවිධාන යොදා තිබිය යුතුය.

4.16 නිවාසයට සෑහෙන පරිදි බාහිර ක්‍රීඩා උපකරණ ලබාගෙන තිබිය යුතුය.

4.17 නිවාසයට සෑහෙන පරිදි ගෘහස්ථ ක්‍රීඩා උපකරණ ලබාගෙන තිබියු යුතුය.

4.18 දරුවන්ට ක්‍රීඩා, නැටුම්. සංගීතය හැදෑරීමට මෙන්ම ළමා සමාජවලට සහ ආගමික සංවිධානවලට සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා තිබිය යුතුය.

**05. ළමා නිවාස කළමණාකරණය පිළිබඳ**

(අ) ළමා නිවාස කළමනාකරණ මණ්ඩලය

5.1 කළමනාකරණ මණ්ඩල රැස්වීම් වල අවශ්‍යතාවය අනුව, නිවාසයේ මව/පියා (පාලක/පාලිකාව අනිවාර්යයෙන්ම කැඳවිය යුතුය.

5.2 කළමනාකරණ මණ්ඩල පත් කිරීමෙන් අනතුරුව එම පත්කිරීම පිළිබඳ වාර්තාවක් පරිවාස කාර්යාලයට පිටපතක් සහිතව, පළාත් කොමසාරිස් වෙත දන්වා යැවිය යුතුය.

5.3 කළමනාකරණ මණ්ඩලය නේවාසික ළමුන් සම්බන්ධව ළමයාගේ ජීවිතයට බලපාන කුමන ආකාරයේ හෝ තීරණයක් ගැනීමට පෙර ඒ පිළිබඳව ස්ථාපන කමිටුව/නිවාසය හැර පරිවාස නිලධාරි/ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි හෝ පළාත් කොමසාරිස් සමඟ සාකච්ඡා කළ යුතුය.

5.4 කළමනාකරණ මණ්ඩලය යටත් පිරිසෙයින් මසකට වරක්වත් රැස්විය යුතු අතර, අඩු තරමින් මාස 03කට වරක්වත් ළමා නිවාස පරිශ්‍රය තුළ රැස්විය යුතුය.

5.5 පාසල් නිවාඩු කාලවලදී හා ළමයාගේ හෝ පවුලේ වෙනත් උත්සව සහ විශේෂ අවස්ථාවන්හිදී ළමයා සිය පවුල වෙත යැවීමට සුදුසු වැඩ පිළිවෙලක් හා පහසුකම් සැලයිය යුතුය.

5.6 ළමයකු ළමා නිවාසයට ඇතුළු කල අවස්ථාවේ පටන් එම ළමයාගේ පවුල සමඟ නිබඳ සම්බන්ධතාවයන් පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය.

5.7 ළමා නිවාසයේ ළමුන්ට සැපයෙන සේවාවන් වැඩිදියුණු කිරීමට මෙන්ම ළමා නිවාසගත ළමුන්ගේ සියලු කායික මානසික හා සමාජීය අවශ්‍යතාවන් මෙන්ම ආරක්ෂාව සැලසීමට උපරිම ලෙස අවශ්‍ය පියවර ගත යුතුය.

5.8 වයස ඉක්මවූ ළමුන් නැවත සමාජගත කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන නොපමාව යෙදිය යුතුය.

5.9 ළමා නිවාසය හා නේවාසික ළමුන් පිළිබඳ පවතින කාර්ය පටිපාටිය හා ක්‍රියාකාරිත්වය පිළිබඳව නිවාසයේ කාර්ය මණ්ඩලය දැනවුත් කළ යුතුය.

5.10 පඩිපාලක සභාවේ නිර්දේශයන් අනුගමනය කරමින්, නිවාස පාලක මව/පියා (පාලිකාව/පාලක) ඇතුළු කාර්ය මණ්ඩලයට වැටුප් හෝ දීමනා ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතුය.

5.11 නිවාසයේ නේවාසිකව සිටින ළමුන්ගේ ආරක්ෂාව හා රැකවරණයත් ඔවුන්ගේ සුභ සිද්ධියත් සැලසෙන පරිදි පහත සඳහන් සේවාවන් සැපයිය යුතුය.

(i) ළමා නිවාසයක සියලු ළමුන්ගේ ආහාරපාන අවශ්‍යතා ගැන සොයා බැලීම ;

(ii) ළමා නිවාසයේ නඩත්තුවට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම, පාලනය සහ ළමුන්ගේ ස්ථාපන කටයුතු ගැන ක්‍රමවත් සැලැස්මක් සැලසුම් කර තිබීම ;

(iii) දෙපාර්තමේන්තු නියමයන් හා උපදෙස් අනුව නිවාසය පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තුවට සැපයිය යුතු වාර්තා නොකඩවා සැපයීම, ළමා නිවාස පිළිබඳව විටින් විට ඇතිවන නීති සංශෝධනය හා නිකුත් කෙරෙන චක්‍රලේඛ අනුව දෙපාර්තමේන්තුව මඟින් දෙනු ලබන උපදෙස් පිළිපැදීම ;

(iv) දෙපාර්තමේන්තුවෙන් දෙන ලද යථායෝග්‍යාධාර හා නඩත්තු ආධාර නියමිත පරිදි වැය කිරීම, එම ආධාර ලබාගැනීමට පෙර පිළිගත් ගණන් පරීක්ෂකවරයකු සහතික කරන ලද ගිණුම් වාර්තාව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

5.12 පහත සඳහන් ලේඛන නිවාසයේ පවත්වාගෙන යා යුතුය.

(i) ඇතුලක් කිරීමේ ලේඛනය ;

(ii) දිනපතා පැමිණීමේ ලේඛනය ;

(iii) ගිණුම් පොත් ;

(iv) ලොග් සටහන් ලේඛනය (දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා) ;

(v) අමුත්තන්ගේ සටහන් ලේඛනය ;

(vi) බඩු වට්ටෝරු පොත ;

(vii) ආහාර සටහන් පොත ;

(viii) නේවාසික ළමුන් සඳහා එක් එක් නේවාසිකයා වෙනුවෙන් ලිපිගොනු ;

(ix) ළමුන්ගේ වෛද්‍ය පහසුකම් පිළිබඳ පොදු ගොනුව ;

(x) දේශීය වශයෙන් ආධාර ලැබීම් පිළිබඳ ලේඛනය ;

(xi) විදේශීය වශයෙන් ආධාර ලැබීම් පිළිබඳ ලේඛනය ;

(xii) තොග පොත.

5.13 දෙපාර්තමේන්තුවෙන් වෙනත් සෑම ආකාරයෙන්ම ලද භාණ්ඩ හා උපකරණ බඩු වට්ටෝරු පොතට ඇතුළත් කළ යුතු අතර, ඒවා වාර්ෂික සමීක්ෂණයකට භාජනය කර තිබිය යුතුය.

(ආ) කාර්ය මණ්ඩල පිළිබඳ ප්‍රමිතීන්

සෑම ළමා නිවාසයකම ළමුන් සම්බන්ධව විධිමත් පුහුණුවක් ලත් භාරකාර මවක්/පියෙකු (ප්‍රධාන පාලක/ප්‍රධාන පාලිකා) සිටිය යුතුය.
ඇය/ඔහු පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති කෙනෙකු විය යුතුය.

(i) අවම වශයෙන් අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි කෙනකු වීම. (දැනට සිටින අයට අදාල නැත) ;

(ii) වයස අවු. 30ට වැඩිවීම හා 60ට අඩුවීම ;

(iii) යහපත් කල් ක්‍රියාවෙන් හා මනා චරිතයකින් යුක්තවීම ;

(iv) කායික මානසික වශයෙන් සෞඛ්‍ය සම්පන්නවීම ;

(v) දරුවන් රැකබලා ගතහැකි පෞරුෂයකින් හා ප්‍රිය මනාප ගතිගුණ වලින් යුතුවීම ;

(vi) ළමා අපයෝජනවලට චෝදනා නොලැබූ කෙනෙකුවීම.

5.14 කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගන්නා සහාය පාලක පාලිකාවන් අවම වශයෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂයයන් 05ක් සමත්වී ඇති අය විය යුතුය. එයට අතිරේකව ඉහත ප්‍රධාන පාලක/පාලිකාවන් සම්බන්ධ වූ සුදුසුකම් සටහනේ ii හා vi දක්වා ඇති අනෙකුත් සුදුසුකම් සපුරා තිබිය යුතුවේ.

5.15 ප්‍රධාන භාරකාර මව/පියා (පාලක/පාලිකා) සහ අනෙකුත් සහායකයින් කලින් කලට දෙපාර්තමේන්තුවේ පුහුණුවීම් වලට සහභාගි විය යුතුය.

5.16 ප්‍රධාන භාරකාර මව/පියා (පාලක/පාලිකා) නිවාසය තුළ පදිංචිව සිටිය යුතුය.

5.17 ප්‍රධාන භාරකාර මව/පියා (පාලක/පාලිකා) මෙන්ම සහාය පාලක/පාලිකාවන් කිසියම් පුහුණුවක් නොලද අයවේ නම් දෙපාර්තමේන්ව මඟින් විටින් විට පවත්වනු ලබන පුහුණු පාඨමාලාවලට සහභාගි වී පුහුණු අවශ්‍යතා සපුරා ගත යුතුය.

(ඇ) සෞඛ්‍ය සේවා හා ආරක්ෂාව පිළිබඳ ප්‍රමිතීන්

5.18 ළමයින්ගේ වෛද්‍ය අවශ්‍යථා ගැන වරින් වර ළමා නිවාසයට පැමිණ පරීක්ෂා කිරීමටත්, එම මධ්‍යස්ථානවලට ළමයින් කැඳවාගෙන ගොස් ප්‍රතිකාර ලබා ගැනීමටත් හැකිවන පරිදි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ පුද්ගලික වෛද්‍යවරයකු සමඟ සාකච්ඡා කොට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය.

5.19 ළමයින්ට අවශ්‍ය ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීමට වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

5.20 ළමා නිවාසයකට ඇතුළත් කිරීමේදී හැම ළමයකු වෙනුවෙන්ම වෛද්‍ය වාර්තාවක් ලබාගත යුතු අතර, හැම ළමයෙකුම වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කොට ඒ බව ළමයාගේ පෞද්ගලික ලිපිගොනුවේ සටහන් කර තිබිය යුතුය. ළමයාගේ උස, බර මෙන්ම හඳුනාගැනීමේ සලකුණු ගැනත් එහි සටහන් තැබීමට විධිවිධාන යොදා තිබිය යුතුය.

5.21 වෛද්‍ය වාර්තාව අනුව, මන්දපෝෂණයෙන් පෙළෙන ළමයින් පෝෂණ මධ්‍යස්ථාන වලට යැවීම සඳහා ප්‍රදේශයේ පලාත් කොමසාරිස්වරයාගෙන් උපදෙස් ලබා ගෙන කටයුතු කර තිබිය යුතුය.

5.22 උප්පැන්න සහතික නොමැති ළමුන්ට අනුමාන වයස් සහතික ලබාදීම සඳහා අවශ්‍ය වෛද්‍ය සහතික ළමුන් වෛද්‍යවරයාට පෙන්වා ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය.

5.23 සෑම ළමයකුගේම කොණ්ඩය, උකුණන් ඇද්දැයි පරීක්ෂා කර බලා එසේ වේ නම් සුදුසු ප්‍රතිකර්ම යෙදිය යුතුය.

5.24 කොණ්ඩය කපා පිරිසිදු කළ යුතු නම් ළමුන්ගේ කොණ්ඩය කපා සුදුසු ලෙස කටයුතු කිරීමට පියවර ගත යුතුය.

5.25 සෑම නිවාසයකම අවම වශයෙන් එක් ප්‍රථමාධාර කට්ටලයක්වත් තිබිය යුතු අතර, එහි අන්තර්ගත ඖෂධ ද්‍රව්‍ය වෛද්‍යවරයකු විසින් නිර්දේශ කරන කලද ඒවා විය යුතුය. ප්‍රථමාධාර පෙට්ටිය කාර්ය මණ්ඩලයේ ඕනෑම අයෙකුට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක තබා තිබිය යුතුය.

5.26 නේවාසික ළමයෙකුට හෝ ළමයින්ට බෝවෙන හෝ වෙනත් අසාධ්‍ය රෝගයක් වැළඳුන අවස්ථාවක ඔවුන් අනෙක් ළමුන්ගෙන් වෙන්කර තැබීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතු අතර, එවැනි ළමුන් සඳහා ලෙඩ කාමරයක් වෙන්කර තිබිය යුතුය.

5.27 ළමයකුට බෝවෙන රෝගයන් වැළඳන අවස්ථාවල එම රෝගී තත්ත්වය අනෙක් ළමුන්ට වැළඳීම වැළැක්වීම සඳහා අවශ්‍ය සෞඛ්‍යමය පියවර ගෙන අනෙක් ළමුන් ඉන් ආරක්ෂා කළ යුතුය.

(ඈ) අධ්‍යාපන සේවා ප්‍රමිතීන්

5.28 වයස අවුරුදු 06ට වැඩි සෑම ළමයකුම පිළිගත් පාසලකට යැවීමට කටයුතු කර තිබිය යුතුය. එසේ පාසලට යැවිය නොහැකි තත්ත්වයේ පසුවන ළමයින් සිටී නම් පුහුණුව ලත් ගුරුවරු මඟින් ආයතනය තුළදී අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සැලසිය යුතුය.

5.29 ආයතනය ළමයින්ගේ පාසල සමඟ ළමයාගේ අධ්‍යාපන කටයුතු පිළිබඳ හා ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය කළ යුතුය. වසය අවුරුදු 06ට අඩු සහ අවුරුදු 03ට වැඩි ළමයින් සියලු දෙනාම ළඟම ඇති පූර්ව පාසලට යැවීමට හෝ එවැනි ළමුන් වෙනුවෙන් පූර්ව පාසල් පන්ති පැවැත්වීමට විධිවිධාන යොදා තිබිය යුතුය.

5.30 ළමා නිවාස කාල සටහනෙක් දිනපතාම පාඩම් කිරීමට හා ක්‍රීඩා කිරීමට කාලය වෙන්කර තිබිය යුතුය.

5.31 ළමයින්ට කිසියම් වෘත්තීය පුහුණුවක් ලබාදීමට වැඩ පිළිවෙළක් යොදා තිබිය යුතුය.

5.32 විශේෂයෙන් වයස අවු. 14 ඉක්ම වූ පාසල් අධ්‍යපනයෙන් සාර්ථක ප්‍රතිඵල නෙලා ගැනීමට නොහැකි හෝ විශේෂයෙන් වෘත්තීය පුහුණුවක් ලැබීමට ලැදියාවක් ඇති හෝ දක්ෂතාවක් ඇති ළමයින් සඳහා වෘත්තීය පුහුණු ලබාදීමේ වැඩ පිළිවෙලක් සකස් කර තිබිය යුතුය.

දෙපාර්තමේන්තුවේ ආධාර ඇතිව ආරම්භ කර ඇති විශේෂ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථාන තිබෙන ළමා නිවාසවලට ඊට සුදුසු ළමුන් යැවීම සඳහා පළාත් කොමසාරිස්ගේ උපදෙස් ලබාගෙන ක්‍රියා කළ යුතුය. එසේ නොමැති අවස්ථාවලදී රජය මඟින් පවත්වනු ලබන වෘත්තීය පාඨමාලා හැදෑරීම සඳහා ළමුන්ට අවස්ථාව සලසා දිය යුතුය.

(ඉ) ළමුන්ගේ වර්ධනයට අදාල විශේෂ සේවා

5.33 එක් එක් ළමයා වෙනුවෙන් පවත්වාගෙන යන විෂය ගොනුවක ළමුන් පිළිබඳ මසකට වරක්වත් සටහන් තැබිය යුතුය.

5.34 එක් එක් ළමයාගේ විෂය ගොනුවල පහත සඳහන් ලේඛන සමඟ සටහන් තබා තිබිය යුතුය.

(i) ළමයාගේ උප්පැන්න හෝ අනුමාන වයස් සහතිකය ;

(ii) වෛද්‍ය වාර්තා/ප්‍රතිශක්තිකරණ දිනයන්/විශේෂ ප්‍රතිකාර ලබාදීම ;

(iii) ළමයාගේ පාඨමාලා සහතික ;

(iv) සමෘද්ධි ප්‍රතිලාභ ලැබීම පිළිබඳ සටහන් ;

(v) ළමයාගේ උස, බර හා වර්ධනය පිළිබඳ සටහන් ;

(vi) ළමයාගේ ශාරීරික/මානසික හා අධ්‍යාත්මික පැවැත්ම හා වර්ධනය පිළිබඳ සටහන් ;

(vii) දෙමාපිය භාරකරුවන් හමුවීම පිළිබඳ සටහන් ;

(viii) හැසිරීම සම්බන්ධව පරිවාස නිලධාරින් සමඟ සාකච්ඡා කොට ගත් පියවරයන් පිළිබඳව සටහන් ;

(ix) ස්ථාපන කමිටු විශේෂ තීරනයන් ගැන සටහන්.

**06. ස්ථාපනය කිරීම**

6.1 ළමුන් ස්ථාපනය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමර්ග ගත යුතුය.

(i) දෙමාපිය භාරකාරාදීන් සිටින සහ දෙමාපිය භාරකරුවන් සොයා ගත හැකි සෑම ළමයකුම ඔවුන් වෙත භාරදීම ;

(ii) දෙමාපිය භාරකරුවන් සිටියද, ඔවුනට ළමයාගැන කටයුතු කිරීමට නොහැකි අවස්ථාවන්හිදී ඒ සඳහා වෙනත් සුදුසු පුද්ගලයින් යටතේ ළමුන් රැඳවීම ;

(iii) අනාථ, අත්හල දරුවන් හෝ හදාවඩා ගැනීමට දෙමාපියන් භාරකරුවන්ගේ නිසි කැමැත්ත ලැබී ඇති සුදුසු දරුවන් නීත්‍යානුකූලව දරුකමට හදාවඩා ගැනීමට දීමට කටයුතු යෙදීම ;

(iv) කෙටිකාලීනව හෝ දීර්ඝ කාලීනව ළමයාගේ අභිවෘද්ධිය සැලසෙන අයුරින් පෝෂක දෙමාපියන් වෙත භාරදීමට කටයුතු යෙදීම හෝ නිවාසයට පැමිණි ළමයා බැලීමට හැකිවන අයුරින් පෝෂක දෙමාපියන් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීම ;

(v) ළමයාගේ අභිවෘද්ධිය සැලසෙන අයුරින් ළමයාට ආධාර සැපයිය හැකි කැපකරු දෙගුරුන් සොයා තෝරා දීම ;

(vi) රැකියා සොයා දීම හෝ රැකියාවන් සොයා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම ;

(vii) රැකියාවක් කිරීමට හැකිවන පරිදි කිසියම් වෘත්ති පුහුණුවක් ලබාදීම ;

(viii) ස්වයං රැකියාවලට යොමු වීමට කැමැත්ත දක්වන ළමුන් වෙත ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සහ ආර්ථික සහාය ලබාදීම ;

(ix) සුදුසු පරිදි විවාහ කරදීම ;

(x) වෙනත් සුදුසු විකල්ප ක්‍රියාමාර්ක ගැනීම.

6.2 ස්ථාපන කමිටුව

දෙපාර්තමේන්තු අනුමැතිය ඇතිව හෝ නැතිව නිවාස ගත කර ඇති ළමුන් වෙනත් නිවාසයකට මාරු කිරීමට හෝ නිවාසයෙන් බැහැර කිරීමට හෝ නේවාසික කාලය දීර්ඝ කිරීමට පෙර අදාල පරිවාස නිලධාරීන් උපදෙස් පරිදි පළාත් කොමසාරිස් අනුමැතිය ලබා ගැනීමට පහත අයගෙන් සමන්විත ස්ථාපන කමිටුවක් රැස්වී තීරණයකට එළඹිය යුතුය.

(i) පළාත් කොමසාරිස්/නිවාස භාර පරිවාස නිලධාරි ;

(ii) ස්වෙච්ඡා සංවිධානයේ නියෝජිතයෙකු ;

(iii) නිවාසයේ භාරකාර මව/පියා ;

(iv) කළමනාකරණ මණ්ඩලයේ නියෝජිතයෙකු ;

(v) දෙමාපිය භාරකරුවකු/නියෝජිතයකු.

6.3 ස්ථාපන කමිටුවට වෙනත් බාහිර පුද්ගලයින් සහභාගි කර නොගත යුතුය

6.4 නිවාසගතකර ඇති ළමයකු නිවාසයෙන් බැහැර කිරීමට වෙනත් නිවාසයකට මාරු කිරීමට, දෙමාපියන්, භාරකරුවන් වෙත බාර දීමට හෝ නේවාසික කාලය දීර්ඝ කිරීම යන කාරණා පිළිබඳව ඊට මාස 03කට පෙර ස්ථාපන කමිටුව තීරණය කර තිබිය යුතුය.

6.5 ඉහත සඳහන් ස්ථාපන කමිටුව අඩුතරමින් මාස 03කට වරක් රැස්විය යුතුය.

**07. පොදු කරුණු**

7.1 සෑම ළමා නිවාසයකම ඒ ඒ ළමයින්ගේ ආගම ඇදහීමට සුදුසු වාතාවරනයක් සහ වැඩ පිළිවෙලක් සහ වැඩ පිළිවෙලක් සකස්කර තිබිය යුතුය.

7.2 පාලක මව/පියා හෝ කළමනාකරුවන් ළමයකුගේ ආගමික මතයට එරෙහිව කටයුතු නොකළ යුතුය.

7.3 නිවාස අධීක්ෂණය භාර පරිවාස නිලධාරි සමඟ සාකච්ඡා කර සෑම පාසල් නිවාඩු කාලයකදීම විශේෂයෙන් සැලකිය යුතු අවහිරතාවයන් නොමැති නම් ළමයාට තම නිවසට හෝ ඥාතිතයකුගේ නිවසට යාමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. එසේ අවස්ථාව ඇති කිසිඳු ළමයකු පාසල් නිවාඩු කාලයේදී නිවාසයේ රඳවා නොගත යුතුය.

7.4 නේවාසික ළමුන්, එම ළමුන් අභිරුචියක් දක්වන්නේ නම් බාලදක්ෂ කණ්ඩායම්වලට සහ ක්‍රීඩා කණ්ඩායම්වලට ඇතුළත් කිරීමට විධිවිධාන යෙදිය යුතුය.

7.5 මාස කිහිපයකට වරක් නේවාසික ළමුන් සියලු දෙනාම අධ්‍යාපනික/විනෝද/වන්දනා ගමන් සඳහා කැඳවාගෙන යාමට විධිවිධාන යෙදිය යුතුය.

7.6 ළමයින්ගේ දෙමාපිය භාරකාරාදීන් අතර සම්බන්ධතා වර්ධනය වන අන්දමේ වැඩ සටහන් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

7.7 ළමුන් විසින් ලියනු ලබන ලියුම්, ඔවුන් නමින් ලැබනෙ ලියුම්, ලබාගන්නා දුරකථන ඇමතුම්, ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන දින පොත්, කාර්ය මණ්ඩලය විසින් හෝ වෙනයම් අයෙකු විසින් විශේෂ හේතුවක් නොමැතිව අධීක්ෂණය නොකළ යුතුය. යම් හෙයකින් එවැනි අධීක්ෂණයක් කළහොත් ඒ පිළිබඳව සටහනක් විෂය ගොනුවට ඇතුළත් කර ඒ පිළිබඳව ගන්නා ලද ක්‍රියාමාර්ගය උචිතයයි අවම වශයෙන් කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුගේ වත් අනුමැතිය ලබාගත් බව ගොනුවේ සටහන් කළ යුතුය.

7.8 විටින් විට ළමා සංවර්ධන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන උපදේශක කමිටු සාමාජිකයින්ට අවශ්‍ය අවස්ථාවල නිවාසයේ කටයුතු සොයා බැලීමට ඉඩ දිය යුතුය.

7.9 ළමා නිවාසයට දේශීය හෝ විදේශීය වශයෙන් ලැබෙන සියලුම මුදල් හා භාණ්ඩ පිළිබඳ යථා පරිදි ගිණුම් පොත් සහ තොග පොත්වල සටහන් තබා තිබිය යුතුය.

7.10 ළමා නිවාසය විදේශීය ආයතන සමඟ කිරීමට බලාපොරොත්තු වන සියලුම ගනුදෙනු හා සම්බන්ධකම් ගැන නිවාසය අධීක්ෂණය කරන පරිවාස නිලධාරි මාර්ගයෙන් පළාත් කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ගත යුතු අතර, දැනට පවත්නා සම්බන්ධතා වාර්තා කළ යුතුය.

7.11 නේවාසික ළමුන්, ඔවුන්ගේ වයස් ගැන සැලකිලිමත් වෙමින්, ඔවුන්ගේ යහපත සඳහා "කණ්ඩායම්" වලට ගොනු කිරීමට විධිවිධාන යෙදිය යුතුය. (මානෙල් නිවාසය, තිස්ස නිවාසය, ආදී වශයෙන්).

7.12 පාලන ත්‍රිකාන්ත ළමුන් සම්බන්ධව ගන්නා පියවර නිවාස අධීක්ෂණය භාර පරිවාස දෙපාර්තමේන්තුවේ නිලධාරියාගේ උපදෙස් පරිදි ලිඛිතව සටහන් කර තිබිය යුතුය.

7.13 ඉහත සඳහන් අන්දමේ පාලන ළමුන් සම්බන්ධයෙන් දැ නොකළ යුතුය.

(i) ශාරීරික දඬුවම් දීම :

(ii) මානසිකව වේදනාවට පත්වන අන්දමේ ක්‍රියාවන්.

**08. ළමා සහභාගිත්වය**

8.1 කිසියම් ගැටළුවකට මුහුණ පෑ අවස්ථාවකදී ළමුන්ට එය නිවාස පාලිකා/මව/පියා කළමනාකරණ මණ්ඩලයට පරිවාස දෙපාර්තමේන්තුවේ නිලධාරියාට දැනුම් දීමට හැකිවන පරිදි වැඩ පිලිවෙළක් සකස් කර තිබිය යුතුය.

8.2 එදිනදා තම ජීවිතයට කෙලින්ම බලපාන සුභසාධක කටයුතු සම්බන්ධයෙන් ළමුන්ගේ අදහස් සැලකිල්ලට ගෙන ඒ අනුව කටයුතු කිරීමට විධිවිධාන සලස්වා තිබිය යුතුය.

**09. ළමයාගේ අනාගත සුභසිද්ධිය සැලසීම**

9.1 ළමයකු නිවාසගත වී දින 30ක් ඉක්ම යාමට පෙර ළමයා නැවත සමාජ ගත කිරීම සහ ඔහුගේ/ඇයගේ වර්ධනය සම්බන්ධයෙන් ලිඛිත සැලැස්මක් (වැඩ පිළිවෙලක්) සකස් කළ යුතුය.

9.2 එම සැලැස්මට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

(i) ළමයාගේ ඉතිහාසය ගැන සලකා බලමින් ඔහුගේ අවශ්‍යතා හඳුනා ගැනීම ;

(ii) ළමයා වෙනුවෙන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු ;

(iii) එම අරමුණු ඉටුකර ගැනීමට අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග ;

(iv) ළමයා සම්බන්ධ අධ්‍යාපන සැලැස්ම ;

(v) දෙමාපියන් හෝ භාරකරුවන් සමග සම්බන්ධතා ඇති කර ගැනීම, වර්ධනය කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධ ක්‍රියාමාර්ග ;

(vi) ළමයාට ලබාදිය යුතු විශේෂිත සේවාවක් වේ නම් ඒවා ;

(vii) පහත සඳහන් පරිදි ළමයා නැවත සමාජයට අන්තරග්‍රහණය කිරීම පිළිබඳ සම්පාදනය වූ වැඩ පිළිවෙල :

* ළමයා පදිංචි විය යුතු තැන.
* ළමායට ආරක්ෂාවක් සපයන්නේ කවුද ?
* නැවත වතාවක් ළමයා නිවාස ගතවීම වැළැක්වීම.
* ළමයා නඩත්තු වන්නේ කෙසේද?

9.3 ළමයා සම්බන්ධව සැලැස්මක් සකස් කිරීමේදී පහත සඳහන් පුද්ගලයින් සම්බන්ධ කරගත යුතුය.

* ළමයාගේ දෙමාපියන් හෝ භාරකරු
* ළමයා
* නිවාස පාලිකා/පාලක තැන
* නිවාසය අධීක්ෂණය කරන පරිවාස දෙපාර්තමේන්තු නිලධාරි තැන.

9.4 ළමයා සම්බන්ධ සැලැස්ම සුදුසු කාලයක් තුළ සමාලෝචය කර අවශ්‍ය සංශෝධන ඇති කළ යුතුය.

9.5 කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා ඇතුළත් (අවුරුද්දකට, දෙකකට උපරිම වශයෙන් අවුරුදු තුනකට) කරන ලද ළමයා එම කාලය සම්පූර්ණ වීමට ප්‍රථම නැවත පවුල වෙත/භාරකරුවකු වෙත හෝ ඥාතියකු වෙත යැවීමට අවශ්‍යයෙන්ම පියවර ගත යුතුය.

05 - 623

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.